
# දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2557 දුරුතු මස බුද දින

■ 2014 ජනවාරි මස 15 වැනි බදාදා



■ දළදා මාළිගාවෙන් නොමිලේ පිරිනමන දහම් පඩුරකි

■ විකිණීම සඳහා නොවේ

# බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමන සිහිගන්වන දුරුතු පෝය



වසරක් උදාවී පළමු මස තුළ උදාවන පළමු පොහොය වන්නේ දුරුතු පොහොයයි. එය අපට අංග කීපයකින්ම වැදගත් වනු ඇත. නව චින්තනයක් ඔස්සේ වසරක් ආරම්භ කිරීමට උත්සුක වන අප සැම දෙනෙකුම දුරුතු පුන් පොහෝ දිනයද සිහියට නගා ගැනුම අපගේ ජීවන ගමනට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. අපගේ එකම ශාස්තෘවරයා වන බුදු හිමි දේශනා කළ දහම් මග ඔස්සේ ගමන් කොට අපේ ජීවිතත් සකස් කර ගැනීමට මෙම උතුම් දුරුතු පොහොය අපට ඉතා වැදගත් වන්නේය.

ක්‍රි.පූ. 6 වන සියවසේ ලොව පහළ වූ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ 80ක් වසැති ජීවිතය තුළින් සිදුවූ තවත් උතුම් ක්‍රියාවක් ලෙස ලංකා ගමනය හැඳින්විය හැකිය. මහාවංශ තොරතුරුවලට අනුව බුදුහිමි ලංකාවට තෙවතාවක් වැඩම කොට ඇත. එයින් පළමුවැන්න සිදු වූයේ ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයෙහි දුරුතු මැදි පොහෝ දිනයේදීය. එය සිදුවූයේ බුදු බවට පත්වී 9 වන මාසය තුළය. උරුවෙල් දනව්වෙහි තුන් බෑ ජටිලයන් ප්‍රමුඛ දහසක් පිරිස දමනය කිරීමෙන් අනතුරුව බුදුහිමි ලංකාද්වීපයට වැඩම කළහ.

එවකට ලංකාද්වීපය තුළ හොඳියුළු යක්ෂ ගෝත්‍රිකයින් ජීවත් වූහ. එවැනි යුගයක බුදුහිමි වැඩම කරන ලද්දේ ඔවුන් දමනය කිරීම උදෙසාය. එම යක්ෂ සේනාව එවකට ජීවත් වූයේ මහියංගන මහවැලි ගංතෙර අසලය. බුදුහිමි වැඩම කොට යොදුන් තුනක් දිගැති මහානාග වනෝද්‍යානය තුළ යක්ෂ සේනාව රැස්ව සිටි එම පිරිස මැද අහසේ වැඩ හුන් අවස්ථාවේ ඔවුන් බුදුහිමි සමග යුද්ධයකට එළඹ සූදානම් විය. පසුව ඔවුන් දමනය කිරීම සඳහා අඳුර, වැස්ස, සුළං, කුණාටු මවා පළමුව ඔවුන් බිය ගැන්වූහ. එම අවස්ථාවෙහි යක්ෂයින් ඔවුන්ට ජීවිත දානය දෙන ලෙස ඉල්ලා සිටියහ.

පසුව බුදුරජාණන් වහන්සේට වැඩ සිටීමට ආසනයක්ද පිළිගැන්වීමෙන් පසු බුදු හිමි අරහි වතුයක් මවා ඔවුන් එක තැනකට රැස් කොට කරුණාවෙන්, දයාවෙන් හා මෛත්‍රියෙන් ඔවුනට සුවිසිදු ශ්‍රී සද්ධර්මය දේශනා කළහ. මෙම පුවතෙහි සිදුවීම ඓතිහාසික වශයෙන් ලක්දිව ආන්දෝලනයට තුඩු දුන්නාට කිසිදු සැකයක් නැත. ශෛලමය වශයෙන් අපට ස්ථිරසාර සාධක නොමැති වුවද එය මිත්‍යාවක් නොවන බව කීම අතිශයෝක්තියක් නොවේ. එවැනි දෙයක් සිදුවීම ලංකාවේ පසුකාලීනව ධර්මය ව්‍යාප්ත වීමටද සාධකයක් විය.

මෙම සිදුවීම තවත් තහවුරු වන්නේ සුමන සමන් දෙවියන්ගේ කතා පුවතත් සමගය. සමනොළ කඳු මුදුනට අරක්ගත් සුමන සමන් දෙවිඳුන්ද දහම් අසා සෝවාන් වූ බව වංශකතාවල පැහැදිලි වේ. එමෙන්ම තොට සුමන සමන් දෙවිඳුන්ගේ ඉල්ලීමකට අනුව බුදුහිමි තම සිරසෙහි කේශ ධාතු මිටක්ද ප්‍රදානය කළහ. පසුව සුමන සමන් දෙවිඳුන් එය රැගෙන බුදුහිමියන්ගේ පාදස්පර්ශය වූ එම බිමෙහි සත් රියනකින් යුතු සෑයක් බඳවා පුද පූජා පැවැත්වූ බවද වංශකථාවල සඳහන් වේ.



මේ අයුරින් පැරණි පරිශීලනය කර බැලීමේදී දුරුතු පොය ලංකා වැසි සියලු දෙනාටම වැදගත් පුන් පොහෝ දිනයක් වශයෙන් හැඳින්වීමට පුළුවන. බුද්ධ ස්පර්ශයෙන් සැදුම් ලත් මේ පින්බිම ලක් දෙරණෙහි ඉපදීමටද පින් කර තිබිය යුතුය. එය ශ්‍රී මහ බෝ සමිඳුන්, ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින මෙම උතුම් පූජනීය භූමිය තුණුරුවනට පූජා කළ, තුණුරුවන්ගේ ගෙද ගුණ නිරන්තරයෙන් සැමර පෙන්නා ද්වීපයකි. එත් එක් යුගවල හෙළයන් පර සතුරු උවදුරු හමුවීයද සිහිප බලවේගයන්ට නතුකර ගැනීමට නොහැකි වූයේද, ඉදිරියට වුවද නතුකර ගැනීමට නොහැකි වන්නේද තුණුරුවන්ගේ ආශිර්වාද බලය නිසාය.

මෙවැනි පින්බිමක උපන් අප සැම දෙනෙක්ම රටත්, රටේ පූජනීය උතුම් වස්තූනුත් ආරක්ෂා කරගැනීමට දිවි හිමියෙන් කැප විය යුතුය. අද වන විට සියලු දේ මුදලට යට වී ඇති බැවින් බුදුහිමියන්ගේ සිරස තබා හෝ පසුව පලා හෝ තම සිතුම් පැතුම් ඉටු කර ගැනීමට මාන බලන දුර්ජනයින් සිටින රටක් බවට පත් වී ඇති යුගයක එවැනි හෙත්, ද්‍රෝහී, පාපකාරී සිතුවිලි ඉවත ලමින්, සුදු පරෙවියන් ඉවකර ගැනීමෙමිලා හැඟෙන ආත්මාර්ථකාමී සිතුවිලි ඉවත් කිරීමත් කළ යුතුය. ඒ වෙනුවට තුණුරුවන්ගේ ගුණ මෙනෙහි කරමින් යහපත් ක්‍රියා කලාපයන් ඇති කර ගැනීම මෙම උතුම් පොහෝ දිනය තුළ කළ යුතු එකම යුතුකම වන්නේය.

පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි



# මමත්වය නැතිකර ගන්නා හැටි

ගතේ හා සිතේ සංයුක්තය මමයි. එනම් ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ආයතන හය හා බැඳී චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ ආදියේ සජීවී තත්ත්වයයි. මෙකී සජීවී තත්ත්වය අජීවී වූ විට මළ ශරීරයක් පමණක් ඉතිරි වේ. මෙකී මළ ශරීරයක් සමඟ "මම" අවසන් වේද? සමාප්ත වේද? එසේ නොමැති නම් විවිධ ශරීර ඔස්සේ "මම" ගලා යන්නේද? හමුවන්නේද? මරණය නමැති තඩිමුම් සරහා පුද්ගලයකුගේ සිත යන ආලිංගව පිඹුණා වූ තොරතුරු වෙනත් සිරුරකට සන්නිවේදනය වන්නේද? නාම රූප (Mind and Body) ජනක ක්ෂේත්‍රයක් නිර්මාණය වන්නේද?

පුද්ගලයකු හා සම්බන්ධ වන "මම" ක්‍රියා කරමින් හා සජීවී වෙමින් සමාජීය සජීවය නේද්ද ගත කරන්නේ කෙසේද? කාලය හා අවකාශය අනුව එම තත්ත්වය කෙසේ සිදුවන්නේද? "මම වර්තමානයේ වෙමිද? අතීතයේ වූයෙමිද? අනාගතයේ වන්නෙමිද? මම ආරම්භ වූයේ කෙසේද? අවසාන වන්නේ කෙසේද? මම සදාකාලිකද? සත්‍ය වශයෙන් "මම" කෙනෙක් සිටිද? මම වෙනත් අයට සමානද? අසමානද?

මහා නිදාන සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ මමත්වයේ වර්තමාන ව්‍යූහය ප්‍රත්‍යක්ෂ කළේ මේ ආකාරයටය. එනම්,

විඤ්ඤාණය මවගේ දරු ගැබට බැස ගැනීමක් නොමැතිව නාම - රූප උද්ගත නොවන බව හා විඤ්ඤාණය මවගේ දරු ගැබට බැස ගැනීමෙන් පසුව එම විඤ්ඤාණය බැහැර වුවහොත් වක්මින් භවයේ සත්වයා උද්ගත නොවන බවයි.

විඤ්ඤාණය බැහැර වීමෙන් පසුද කලලයක් සජීවී තත්ත්වයක තිබිය හැකිය. එසේ නොමැති නම් අජීවී තත්ත්වයට පත්විය හැකිය. මෙම වෙනස රඳා පවතින්නේ කලලයේ ස්වභාවය හා එය වර්ධනය වී ඇති අවස්ථාව අනුවය. ඉතා කලලය තවදුරටත් සජීවී නම් වෙනත් විඤ්ඤාණයකට එම කලලය සම්බන්ධ විය හැකිය. කලලය අජීවී නම් ගබ්සා වීම සිදුවේ. සජීවී කලලයකට සම්බන්ධ වන විඤ්ඤාණය යනු කුමක්ද? පෙර භවයකදී පුද්ගලයකු මිය යන විට ජනිත වූ චුතිචිත්තය සහිත ප්‍රතිසන්ධි විඤ්ඤාණයයි. එසේම මවගේ කලලයෙන් ඉවත්වූ විඤ්ඤාණයයි. සමස්ත නාමරූප ක්‍රියාවලියම සිදුවන්නේ හේතුඵල හා ඵලහේතු සම්බන්ධය අනුවයි.

"මම" තුළ අන්තර්ගත වර්තමානය කුමක්ද? අනාගතය කුමක්ද? නැවත නැවත ඉපදීමේ යාන්ත්‍රණය කුමක්ද? මෙම ප්‍රශ්නාවලියට සාරගර්භ පිළිතුරක් අභිධම්මපිටකයේ සූත්‍රයන් ලබාගත හැකිය. එනම් සියලු දෘෂ්ටීන්ගෙන් බැහැර විය යුතුය. රූපය මේය, රූපයාගේ හේතුව මේය, රූපයාගේ විනාශය මේය, වේදනාව මේය, වේදනාවේ හේතුව මේය, වේදනාවේ විනාශය මේය, සංඥාව මේය, සංඥාවේ හේතුව මේය, සංඥාවේ විනාශය මේය, සංස්කාරය මේය, සංස්කාරයේ හේතුව මේය, සංස්කාරයේ විනාශය මේය, විඤ්ඤාණය මේය, විඤ්ඤාණයේ හේතුව මේය, විඤ්ඤාණයේ විනාශය මේය, මෙකී සියල්ලේ ඇතිවන මමය, මාගේය තණ්හාව දුරුකළ යුතුය. නිරුද්ධ කළ යුතුය. ඇලීම, ගැටීම, බැඳීම නොමැතිව මිදුණු තත්ත්වයට පත්විය යුතුය. එම තත්ත්වයේදී වර්තමානය, අනාගත මම හා බැඳී ව්‍යූහය අවබෝධ වේ. එමෙන්ම ඉපදීමේ යාන්ත්‍රණය අවබෝධ වේ. ප්‍රත්‍යක්ෂ වේ. සිතින් හා ගතින් පංච උපාදානස්කන්ධය හා බැඳී මම සංයුක්ත වී ඇත. එනම් මම නිර්මාණය වන්නේ, ජනිත වන්නේ, නිරුද්ධ වන්නේ පටිච්චසමුප්පන්නවය. එනම් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූපය සිදුවේ.

බටහිර විද්‍යාවද මෙම තත්ත්වය පිළිගැනීමට අද සූදානමය.

'Conciousness' යනුවෙන් බටහිර විද්‍යාඥයෝ මෙකී විඤ්ඤාණ තත්ත්වය හඳුන්වති. නමුත් බටහිර විද්‍යාවට සාධනීය කරුණු සහිතව මෙම තත්ත්වය ඔප්පු කිරීමට තවමත් ප්‍රමාදය. බටහිර විද්‍යාවේ හේතුඵල සම්බන්ධය විෂය නොවේ. ඩිම්බ හා ශුක්‍රාණු පෝෂණයෙන් මුල් ජන්මාණුව නිපදවීම හා පදාර්ථ ශක්ති පාදක වීමෙන් ද්‍රව්‍යමය වර්ධනයක් පමණක් බටහිර විද්‍යාවට විෂය වී ඇත.

මම පිළිබඳ පටිච්චසමුප්පන්න ස්වභාවය ප්‍රත්‍යක්ෂ කළ විට, ගත පදනම්ව විඤ්ඤාණ හසේ ක්‍රියාකාරීත්වය සහ සිත විසින් ඒ ආලිංගව නොවනසන "මම" සංකල්පය අවබෝධ කළ හැකිය. එමෙන්ම විශේෂත්වය වන්නේ මම සංකල්පයේ නොබිඳැකීමේ මාවත් වසා දැමීමේ හැකියාව මෙම ප්‍රත්‍යක්ෂ අවබෝධයත් සමග අවදි වේ.

සියලු තණ්හා ක්ෂය වීම පිළිබඳ යථා වූ සංඛ්‍යාතයක් සහිත අධ්‍යාත්මයේ ශබ්දය ගෙවත් ධ්වනිය ජනනය වේ.


පුද්ගලයකුගේ පුනර්භවය යනු සතත ශුද්ධ මමත්වයේ චෛතසික ක්‍රියාවලියේ සම්ප්‍රේෂණයයි. එනම් භවයෙන් භවයට චෛතසික ක්‍රියාවලිය සංක්‍රමණය වීමයි. මමත්වයේ චෛතසික ක්‍රියාවලිය නතර වූ විට එනම් මමත්වයේ චේතනා නතර වූ විට "මම" විමුක්ති ගතවේ. මම නැවත උත්පාදනය වීම නතර වේ. විවිධ ශරීර ඔස්සේ භවයෙන් භවයට සංක්‍රමණය වීම නවතී. විවිධ ශරීර ඔස්සේ භවයේ විද්‍යාමානය සමාප්ත වේ.


භවයේ පැවැත්ම සඳහා කළ යුතු ප්‍රායෝගික ක්‍රියාමාර්ගය කුමක්ද? දම්සක් පැවතුම් සූත්‍රය අවබෝධ කිරීම තුළින් මමත්වය සිඳ දැමිය හැකිය. භවයේ ගමන එවිට සමාප්ත වේ. මමත්වයට සමුදිය හැකිය. මම අවබෝධ වේ. මම මමත්වයේ සිඳී විශ්ලී යයි.

පූජ්‍ය කොසෙල්පොත මෛත්‍රීරතන හිමි

"යමකු බැරිවීමකින් වරදක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. වරදට ආශා නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."

# නැවත ඉපදීම හෙවත් පුනර්භවය තහවුරු කරගන්නේ කෙසේද?





නූතන ලෝකයේ විවිධ රටවලින් පුනරුත්පත්තිය සම්බන්ධ සනාථ වන ප්‍රවෘත්ති බොහෝ ප්‍රමාණයක් අසන්නට ලැබී ඇත. ඒ අනුව පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාස නොකළ අය (හේතුවාදීන්) පවා විවිධ පර්යේෂණ කිරීමට පෙළඹී ඇත. එහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ පුනරුත්පත්තිය පිළිබඳ තව පිළිගැනීමක් හෙවත් විශ්වාසයක් ඔවුන් තුළ ගොඩනැඟීමයි.

මේ පර්යේෂණ අතර ඇමෙරිකාවේ ජීවත් වූ ඇලෙක්සැන්ඩ්‍රිනා සමෝනා නම් දැරියගේ කතාව බොහෝ දෙනකුගේ අවධානයට ලක්වූ එකකි. ඇමෙරිකාවේ වෛද්‍යවරයෙකුගේ දියණියක් වූ ඇලෙක්සැන්ඩ්‍රිනා සමෝනා පස් හැවිරිදි වියේදී එනම් 1910 මාර්තු මස 5 වන දින මරණයට පත්වූවාය, තම සිඟිති දියණියගේ මරණයෙන් මව දැඩි සේ ශෝක වූවාය. ඇය එවකට ශෝකයට පත් වූයේ වෛද්‍යවරුන් විසින් ඇයට නැවත දරුවන් නොලැබෙන බව පැවසීම නිසාය. දැරියගේ මරණයෙන් දින තුනකට පසු ඇය ඉතා පැහැදිලි සිහිනයක් දුටුවාය. එහි, මියගිය ඇගේ සිඟිති දියණිය සිහිනෙන් ඇ වෙත පැමිණ,

"අම්මේ, දුක්වෙන්න එපා. මා ඔබගෙන් සදහටම වෙන්ව නැහැ. මා නැවත කුඩා දැරියක ලෙස ඔබ වෙත එනවා" යන්න පැවසීමයි.

වෛද්‍යවරුන් විසින් ඇයට තවත් දරුවන් නොලැබෙනු ඇතැයි පැවසීම නිසාත්, පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාසයක් නැති නිසාත් මෙය ඇගේ සැනසීමට හේතුවක් කරුණක් නොවීය. මේ සිහිනය ඇයට දින කිහිපයක්ම පෙනෙන්නට විය. එම වර්ෂයේම අප්‍රේල් මස 10 වෙනි දින ඇ ගැබ්ගෙන ඇති බව වෛද්‍යවරුන් විසින් ඇට දැනුම් දෙන ලදී. එහෙත් වෛද්‍යවරුන්ගේ නියමයන්ට අනුව නැවත ඇයට දරු ප්‍රසූතියක් සිදුකිරීම වඩාත් දුෂ්කර කටයුත්තක් විය.

නැවතත් දිනෙක සිහිනෙන් පෙනී සිට ඇගේ සිඟිති දියණිය මෙසේ පවසා ඇත.

"අම්මේ තවත් අඬන්න එපා. මා ඔබගේ සිඟිති දියණියක් ලෙස නැවත ඔබ වෙත එනවාමී" යනුවෙනි. මෙහිදී මව තවත් ප්‍රශ්නයකට පත්වූ අතර තවත් දිනක සිහිනෙන් පෙනී සිට සිය සිඟිති දියණිය පැවසූ වදනකින් මව වඩාත් මවිතයට පත්විය. එනම්, "අම්මේ මා ඔබ ළඟට එන්නේ තනිව නොවේ. තවත් සහෝදරියක සමඟය" යන්නයි. මේ ප්‍රකාශයෙන් පසුව වෛද්‍යවරුන් පරීක්ෂා කිරීමට දැනගන්නට ලැබුණේ ඇය නිවුන් දරුවන් ලැබීමට යන බවයි. ඇලෙක්සැන්ඩ්‍රිනා සමෝනාගේ ප්‍රකාශය සනාථ කරමින් ඇගේ මව එම වර්ෂයේම දෙසැම්බර් මස 22 වන දින නිවුන් දරුවන් ප්‍රසූත කළාය.

මෙසේ උපන් දැරියන් අතුරින් ඇලෙක්සැන්ඩ්‍රිනාට සමාන වූ දැරිය ස්වභාවය, හැසිරීම් රුචි අරුචිකම් සියල්ලක්ම ඇලෙක්සැන්ඩ්‍රිනා සමෝනාගේ චරිතයටම සමාන වී ඇත. ඇලෙක්සැන්ඩ්‍රිනා සමෝනා වමත්කාරියක් වූ අතර ඇයට සමානවූම උපන්වූ දැරියද වමත්කාරියක් වූවාය. ඇය පැවසූ සෑම දෙයක්ම පෙර දැරියගේ ජීවිත කතාවට බොහෝ සෙයින් සමානව ඇත. මෙම ඇලෙක්සැන්ඩ්‍රිනා සමෝනාගේ කතාව බටහිර චින්තනය තව මඟකට හෙවත් පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාසය ගොඩනැඟීමට තරම් සමත්ව ඇත.

"පව් කරන්නා මෙලොවදී ශෝක කරයි. පරලොවදී ශෝක කරයි. දෙලොවම ශෝක කරයි. හේ තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි. වෙහෙසෙයි පෙළෙයි."

## ලංකාව තුළ පුනරුප්පත්තිය තහවුරු කළ අවස්ථා තිබේද?

ශ්‍රී ලංකාව තුළද පුනරුත්පත්තිය පිළිබඳ බොහෝ කතාවන් කලින් කලට අසන්නට ලැබේ. ඒවා පිළිබඳ විවිධ පර්යේෂණ කර ඇති අතර බොහෝමයක් සත්‍ය සිද්ධි ලෙස තහවුරු කරගෙන ඇත. මෑතකදී පුනරුත්පත්තිය පිළිබඳ කරුණු කිවූ දරුවකු මාතර ප්‍රදේශයෙන් හමුවී ඇත. ඔහු පැවසූ ඔහුගේ පෙර ආත්මය පිළිබඳ කරුණු මෙසේය.

පෙර ඔහු මහනුවර ආසන්නයේ ඉපදී සිටි අතර තවත් පිරිසක් සමග මහවැලි ගඟේ දිය නෑමට ගොස් ලේවැල්ල ප්‍රදේශයේදී දියේ ගිලී මරණයට පත්ව ඇත. ඔහු මිය යනවිට පසළොස් වැනි වියේ පසුවූ අතර ඊට වර්ෂයකට පමණ පසු ඔහු මාතර ප්‍රදේශයේ ඉපදී ඇත. බහතෝරන වියේ සිටම ඔහු නුවර ගැන වැඩිපුර කතා කොට ඇත. නිතරම නුවර බලන්ට යාමට අවශ්‍ය බව පවසා ඇත.

දරුවාගේ ඇවිටිලි නිසා දිනක් දෙමාපියන් ඔහු නුවරට රැගෙන විත් මාලිගාව පෙන්වා ඇත. එහිදී ඔහු පැවසූ බොහෝ සිද්ධීන් දෙමාපියන් මවිතයට පත්කොට ඇත. මාලිගාව තුළ ඔහු හැසිර ඇත්තේ වඩාත් හුරුපුරුදු අයෙකු ලෙසය. එපමණක් නොව මාලිගාවට බෝම්බ ගැසූ සිද්ධිය, පෙරහර, පෙරහරේ නැටුවූවන්, හතර දේවාලය ආදිය පිළිබඳ බොහෝ දේ පවසා ඇත.

ඔහුගේ මග පෙන්වීම යටතේ දරුවාගේ පෙර දෙමාපියන්, නිවස, ඥාතීන් ආදී සියල්ල හඳුනා ගැනීමට හැකිව ඇත. ඔහුගේ ඇඳුම්-පැළඳුම්, භාවිත කළ උපකරණ ආදිය පමණක් නොව ඉගෙන ගත් පාසල, යාළුවන් මෙන්ම ඉගැන්වූ ගුරුවරුද හඳුනාගෙන ඇත.

මෙවැනි සිද්ධි බොහොමයක් අප රට තුළින් නිතර නිතර අසන්නට ලැබෙයි. මෙම සිද්ධි බොහෝමයක් නිවැරදි ලෙස තහවුරු කරගෙනද ඇත. එබැවින් මෙවැනි සිද්ධිවල ඇති පෙර භවයන්හි ඇති සබඳතා මගින් පුනරුත්පත්තිය තහවුරු කර ගත හැකිය.


## මේ භවයේ ශරීර ලක්ෂණ පෙර භවයට සමානද?

පුනරුත්පත්තිය පිළිබඳ පර්යේෂණ පවත්වන විද්‍යාඥයින්ගේ ප්‍රධාන අවධානය යොමුවන්නේ පර්යේෂණයට ලක්කරන පුද්ගලයාගේ පෙර භවයේ ලත් අත්දැකීම්, ගති ලක්ෂණ හෙවත් හැඩහුරුකම් පිළිබඳවය. විශේෂයෙන් බහ තෝරන වියේදීම පෙර භවයේ අත්දැකීම් විස්තර කරන දරුවන් මෙම පර්යේෂණ සඳහා යොදාගනු ලැබේ. පෙර භවයේ තමා ප්‍රිය කළ දේවල්, ප්‍රිය කළ ස්ථාන, ප්‍රිය කළ පුද්ගලයින් ආදිය මෙම පර්යේෂණවලින් තහවුරු කොටගෙන ඇත.

මෙවැනි දේ තහවුරු කොට ගත හැකි සිද්ධි බොහෝමයක් සොයාගෙන ඇති අතර කොත්මලේ ප්‍රදේශයෙන් වාර්තා වී ඇති එක් සිද්ධියක් මෙසේය. 1959 වර්ෂයේදී රම්බොඩ රෝහලේ උපන් දැරිය නමින් චන්ද්‍රාවති වූවාය. වයස අවුරුදු 5 පමණ වනවිට මේ පුංචි දැරිය අනලස්ව මවගේ කටයුතුවලට උදව් වන්නට වූවාය. මව වතුර ගෙන ඒමට යන විට මව සමග යාම ඇගේ සිරිත විය. මව වතුර කලයක් උකුලට ගෙන එන විට මේ පුංචි දියණියද ඇගේ කලය උකුලේ තබාගෙන ඒමට පුරුදුව සිටියාය.

1965 වර්ෂය වනවිට ඇගේ වයස අවුරුදු හයහමාරක් විය. හදිසියේ වැළඳුණු උදරාබාධයකින් දැඩි ලෙස රෝගාතුර වූ ඇය කොතරම් ප්‍රතිකාර කළත් සුවකරගත නොහැකි වූ තැන දෙමාපියන්ගේ හා ඥාතීන්ගේ සෝ සුසුම් මැද අවසන් ගමන් ගියාය.

ඇගේ මරණින් වසරක් ගිය තැන එනම් 1966 වර්ෂයේ චන්ද්‍රාවතියගේ මව තවත් දරුවකු ප්‍රසූත කළාය. පිරිමි දරුවකු වූ ඔහු කුමාරසිරි නම් විය. මේ පුංචි දරුවාගේ උපතේදීම සිරුරේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් විය. එනම් කරාබු පැළඳවීමට කන් පෙති සිදුරු කළ සිදුරු හා සමාන සලකුණු දෙකක් කන් පෙතිවල දක්නට ලැබීමයි.



බහ තෝරන වියට පත්වීමත් සමග මේ කුඩා දරුවා මවගෙන් ඉල්ලා සිටියේ "කෝ මගේ අරුංගල් දෙක?" යනුවෙනි. මෙයින් පුදුමයට පත් දෙමාපියන් ඔවුන්ගේ මියගිය චන්ද්‍රාවතිය දෙසට නැවත වරක් යොමුකොට ඇත. එනම් මේ පුංචි දරුවාගේ හැසිරීම බොහෝ සෙයින් චන්ද්‍රාවතියගේ හැසිරීම්වලට සමාන බව අවබෝධ කර ගැනීමයි.

මේ කුමාරසිරි දරුවා බොහෝ සෙයින් ප්‍රියකොට ඇත්තේ ගවුම් ඇඳීමටය. ඔහු බොහෝ සෙයින් ඇලුම් කොට ඇත්තේ පෙර ආත්මයේ චන්ද්‍රාවතියද ඇලුම් කළ නිල් පැහැති ගවුම් ඇඳීමටය. ඔහුගේ ප්‍රියතම ආහාරය වී ඇත්තේ අඹය. චන්ද්‍රාවතීද බොහෝ ලෙස ප්‍රියකොට ඇත්තේ අඹ කෑමටය. වයස අවුරුදු හය පමණ වනවිට මේ පුංචි දරුවා පෙර ආත්මයේ තමාගේ මරණය සිදුවූ අයුරු හා වළ දමූ ස්ථානයද ඥාතීන් හා පාසල් ගුරුවරුන් තිගැස්සෙනසේ හඳුනාගෙන ඇත. එපමණක් නොව පෙර ආත්මයේ චන්ද්‍රාවතිය මෙන් මෙම ආත්මයේ කුමාරසිරි දරුවාද පුංචි කලයක් රැගෙන මව සමග දිය ගෙන ඒමට විශේෂ කැමැත්තක් දක්වා ඇත.

මෙම පුනරුත්පත්ති පර්යේෂණය තුළින් නම් පෙර ආත්මයේ අත්දැකීම් චන්ද්‍රාවතී නම් දැරිය කුමාරසිරි ලෙස මේ ආත්මයේ ඉපිද ප්‍රකාශයට පත්කොට ඇති බව තහවුරු වේ.

## ස්ත්‍රිය පුරුෂයෙකු වූ අවස්ථාවක්


මෙම පර්යේෂණයෙන් අපගේ අවධානය යොමුවන තවත් පැතිකඩක් වනුයේ යමෙක් දිගින් දිගටම පුරුෂයෙකු වශයෙන් පමණක්ම හෝ ස්ත්‍රියක වශයෙන් පමණක්ම හෝ නොඉපදෙන බවය. ඇතැම්විට ස්ත්‍රියක්ව උපදින තැනැත්තිය ඊළඟ භවයේ පුරුෂයෙකු වශයෙන් ඉපදීමට පුළුවන. එමෙන්ම පුරුෂයෙකු වශයෙන් උපදින තැනැත්තා ඊළඟ භවයේදී ස්ත්‍රියක වශයෙන් ඉපදීමට පුළුවනි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන්නේ අප සිදුකරන කුසලාකුසල කර්මයන්ය. පුරුෂ ආත්මයක් ලැබීමට පින්කර තිබිය යුතු බව ධර්මයේ ඉගැන්වෙයි. ඒ අනුව බලන විට ඉහත කතාවේ චන්ද්‍රාවතියගේ අකුසල කර්ම ගෙවී ගොස් පුරුෂ ආත්මභාවයක් ලැබීමට තරම් පුණ්‍ය මහිමය ඉස්මතු වීම නිසා එසේ සිදුවූවා විය හැක.

තවත පුනරුත්පත්ති පර්යේෂණයන්ගේ විශේෂ අවධානය යොමුවූ තවත් අංශයකි, හැඩහුරුකම. විශේෂයෙන් මුහුණේ හැඩහුරුකම (Facial Features) පිළිබඳ අවධානය යොමුවී ඇත. බොහෝ අවස්ථාවල දෙමාපියන්ගේ හැඩහුරුකම් දරුවන් සඳහා බලපායි. එහෙත් දෙමාපියන්ගේ හැඩහුරුකම් දරුවන් සඳහා බලනොපාන අවස්ථාද ඇත. සමහරවිට එකම දෙමාපියන්ගේ දූ දරුවන් පවා අසමාන මුහුණු හැඩරුව ලැබීම සාමාන්‍ය ලක්ෂණයකි. සමහරවිට හැඩරුව මගින් පවුල් සාමාජිකයන් නිරණය කර ගැනීමේ හැකියාව නොතිබීමටද පුළුවනි. එහෙත් පුනරුත්පත්ති පර්යේෂණවලදී මුහුණේ හැඩරුව පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරයි. මියගිය අය යළි ඉපදීම අනාවරණය කරගත් බොහෝ අවස්ථාවල මියගිය පුද්ගලයාගේ හැඩරුව නැවත උපන් පුද්ගලයාගේ සමාන වූ අවස්ථා ඉන්දියාව, බුරුමය, ඉතාලිය, එංගලන්තය හා ශ්‍රී ලංකාව වැනි රටවලින් සොයාගෙන ඇත.

ඇතැම් දරුවන්ගේ මුහුණේ හා ශරීරයේ තිබූ ලප කැළැල් පවා ඊළඟ භවයේ උපන් දරුවන්ගෙන් එලෙසම සොයාගෙන ඇති බව පර්යේෂකයින් තහවුරු කොට ඇත. ඇතැම් පර්යේෂණවලින් තහවුරු කොටගෙන ඇති පරිදි යමෙක් මරණයට පත්වීමට පෙර මාරාන්තික සලකුණු නැවත ඉපදීමේදී ශරීර ලක්ෂණ ලෙස ඉස්මතු වූ අවස්ථා ඇත. උදාහරණ ලෙස පිහි ඇනුම්, වෙඩි වැදීම් ආදියෙන් මියගිය ඇතැම් පුද්ගලයින් නැවත ඉපදීමේදී ඒ ස්ථානවල එම සලකුණු කැළැල් (උපන් ලප) ලෙස සටහන්ව ඇත.

**ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත**
**පූජ්‍ය මහරැම්බෑවේ පාලිත හිමි**

"අනුන්ගේ රළු පරළු කතාත්, අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# ඔය කුණු කය අතහැර යන්න

වියපත් බව හෙවත් මහලු බවට පැමිණීමට හැම දෙනාම අකමැති වෙති. එහෙත් එයින් බේරීමට කිසිවෙකුටත් නොහැක. අඩු ආයුෂයකින් මියැදීමට සිදු නොවන හැම දෙනාම වයසට ගොස් මියැදෙති. සිරුර දිරාපත් වීම, වයසින් වැඩිවීම, ශක්තිය හීන වීම, අවපැහැ ගැන්වීම, රෝගාබාධවලට වහා ගොදුරු වීම, සිහි කල්පනාව අඩුවීම වියපත් බවේ ලක්ෂණ කිහිපයකි. ජීවිත අත්දැකීම් බහුල වීම, දැනුම හා අවබෝධය පුළුල් වීම වැනි සුබවාදී ලක්ෂණද වියපත් වූ අය තුළ විද්‍යමාන වේ.

වියපත් බව පිළිබඳ කරන ලද පර්යේෂණ තුළින් විවිධ තොරතුරු අනාවරණය කරගෙන තිබේ. බෞද්ධ ඉගැන්වීම් අනුව ජීවිතයේ වයස් කාල 03කි. එනම් බාල, තරුණ හා මහලු වශයෙනි. මෙයින් තෙවැනි කාලච්ඡේදය වියපත් කාලයයි. අටුවාචාරී බුද්ධඝෝෂ ආචාර්යයන් වහන්සේ මිනිස් ජීවිතයක ආයුෂ කාලය වර්ෂ 100 ලෙස ගෙන වසර 10 බැගින් කාණ්ඩ 10 ට බෙදා දක්වති. එහි වයස අවු 50-60 දශකය හානි දශකය ලෙස නම් කරයි. ඒ කායික පරිහානිය ඇරඹෙන කාලය ලෙස සලකාගෙනයි. වර්තමාන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය උපචිත ආයු කාලය අවු 75-80 වන බැවින් වියපත් බව ඇරඹෙන සීමාව ලෙස අවු 40-45 සමඟ ගැනීමෙහි වරදක් නැත. ඒ අනුව වයසින් අවු 60 ඉක්මවා ඇති අය වියපත් වූවන් ලෙස සැලකීම යුක්ති යුක්තය.

මේ අතර තුරුණු වියේදීම වියපත් වූ අයද සිටිති. ඒ කයින් නොව සිතින් වියපත්වූවන්ය. තුරුණු වියේදීම දුර්වල මානසික ලක්ෂණ පෙන්වන , ධනය උපයා ගැනීමේදී පවා අලසකමක් දක්වන , පරපුටු ජීවිත ගෙවන පිරිස මේ කොටසට ඇතුළත් වේ. මේ පිරිස සමාජයට මෙන්ම රටටද බරකි. එමෙන්ම වයසින් ජීවිතයේ අගභාගයට පැමිණිය ද සිතින් යෞවනත්වයේ පසුවෙන අයද දකිය හැක. වියපත්ව සුසුම් හෙලමින් දිවි ගෙවන උදවියට නකුල පිතු සූත්‍රය තුළින් පැහැදිලි කරන්නේ ජීවිතයේ අවසාන භාගය සතුටින් සොම්නසින් ගත කිරීම පිළිබඳවයි.

බුදුරජාණන්වහන්සේ භග්ග ජනපදයේ සුංසුමාරගිරි නම් නගරයේ භේසකලා වනයේ වැඩ වසන සමයක නකුල නම් දරුවාගේ පියා, නකුලපිතා උන්වහන්සේ හමුවට පැමිණියේය. බුදු රදුන්ට ගෞරව දක්වූ ඔහු මෙසේ කීය. "ස්වාමීනි, මම මහලුය, වයෝවෘද්ධය, රෝගී වූ කයකට උරුමකම් කියයි. මහල්ලෙක් බවට පත්ව සිටී. ඔබ වහන්සේ භික්ෂූන් වහන්සේට සිත දියුණුකර ගැනීම පිණිස අවවාද කරන්නා සේ මට ද අවවාද කරන සේක්වා. එය මට දිගු කලක් හිත සුව පිණිස හේතු වන්නේ යැයි" ඉල්ලා සිටියේය.

බුදුපියාණන් වහන්සේ නකුල පියාට හොඳින් සවන්දීමෙන් පසුව ඔහුගේ හිතේ හටගෙන ඇති සිතිවිලි මැනවින් වටහාගෙන මෙසේ වදාළහ.

**"එවමේතං ගහපති , එවමේතං ගහපති. ආතුරෝ හායං ගහපති. කායො අණ්ඩභූතො පරියොනද්ධො යො හි ගහපති. ඉමං ගහපති කායං පරිහරන්තො මුහුත්තම්පි ආරොග්‍යං පටිජානෙය්‍ය කිමඤ්ඤත්‍ර බාල්‍යා"**

"එහෙමයි ගහපති එහෙමයි. මේ කය රෝගයෙන් දිරාපත්වීමෙන් හාත් පසින්ම වෙලුන ලදී. රෝග වැළඳීම හා දිරාපත්වීම උරුමකරගත් සිරුරකට හිමිකම් කියන කවරෙකු හෝ එයින් මොහොතකටවත් නීරෝගිකමක් බලාපොරොත්තුවන්නේ නම් එය මෝඩකමකි."

තමන් ලද ශරීරය දිරාපත් නොවන , විනාශ නොවන එකක් ලෙස බොහෝදෙනා විශ්වාස කරති. දිරාගිය සිරුරක් ඇති වෙනත් උදවිය ඇහැ ගැටුනත් , මැරුණු පුද්ගලයින්ගේ අවසන් කටයුතු වලට සහභාගී වී ඇතත් බොහෝ දෙනෙකුට තමන් එවැනි තත්ත්වයකට පත්වන සිරුරකට හිමිකම් කියන බව අමතක වෙති.


**"පරිජිණ්ණ මිදං රූපං රොග නිඩ්ඩං පභංගුරං"** ධම්මපදයේ එන මේ ගාථා අර්ථයෙන් ද කියවෙන්නේ දිරාපත්වීම හා රෝගාබාධවලට ගොදුරු වීම සිරුරෙහි ලක්ෂණ බවයි.

තමන් වියපත් ජරා ස්වභාවය උරුමකර ගැනීම නිසා සිත් වේදනාවට පත් නකුල පිතා හට ජීවිතයේ යථා ස්වභාවය පැහැදිලි කර දුන් බුදුපියාණන් වහන්සේ, දන් තමන් වියපත් බව ගැනවත්, රෝගී වීම හා ජරාවට පත්වීම ගැනවත් සිත සිතා නොසිට, රෝගී වූ කයක් ඇතත් මට නීරෝගී මනසක් ඇතැයි සිත්විය යුතු බව වදාළහ. "එවං සික්ඛි තබ්බං ආතුර කායස්ස මේ සතො චිත්තං අනාතුරං භවිස්සන්ති". බුදුරදුන්ගේ දේශනාව ඇසූ නකුල පිතා ඉමහත් සතුටට පත්ව උන්වහන්සේට වැඳ එකත්පස්ව සිටියේය. එතැනට පැමිණි සැරියුත් මහ රහතන් වහන්සේ ඔහුගේ මුහුණෙහි වූ ප්‍රසන්න බව දැක, "ගෘහපතිය ඔබ තුළ විශේෂයෙන් පැහැදුනු පෙනුමක් ඇත. ඔබගේ ඉන්ද්‍රියන් පිරිසිදුය. මුහුණ වර්ණවත්ය. ඉතාම පැහැපත්ය. අද ඔබට බුදුහාමුදුරුවන්ගෙන් ධර්ම කතාවක් අහන්න ලැබුනේ දැයි"

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

විමසූහ. සැරියුත් තෙරුන්ට පිළිතුරු දෙමින් ඔහු ප්‍රකාශ කළේ, භාග්‍යවතුන් වහන්සේ තමන්ව අමෘතාභිෂේකයෙන් අභිෂේක කළ බවයි. "භගවතා ධම්මියා කථාය අමතෙන අභිසිත්තොති" රස අතර ඉහළම රසය අමෘතය යැයි පිළිගනේ, නකුලපිතා සවන්දුන් ධර්මය ඔහුට අමෘතයකි. ඉතා මිහිරි ධර්මයක් තමන් ශ්‍රවණය කළ බව ඔහු පවසා බුදුරදුන් හා තමා අතර ඇති වූ කතා බහ පිළිබඳව උන්වහන්සේට පැහැදිලි කර දුන්හ. නකුලපිතු ගෘහපතියාට සවන්දුන් සැරියුත් තෙරුන් වහන්සේ , "ගෘහපතිය තොපමණකින් ගිලන් කය ඇත්තේද, ගිලන් සිත ඇත්තේද, තොපමණකින් ගිලන් කය ඇත්තේද, නොගිලන් සිත ඇත්තේදැයි ඔබ බුදුරදුන්ගෙන් අසා දැන ගත්තේ නැද්දැයි" ඇසූහ. තමාට එවැන්නක් ඇසීමට සිත යොමු නොවූයේ යැයි ඔහු ප්‍රකාශ කළේය. ඒ කාරණය සැරියුත් තෙරුන් වහන්සේ පැහැදිලි කර දෙන්නැයි ඉල්ලා සිටියේය.

සැරියුත් තෙරුන් වහන්සේ ගිලන් සිරුරක් ඇත්තෙකු ගිලන් වූ මනසක් ඇති අයෙකු බවට පත්වීමට හේතු පැහැදිලි කළහ. ආර්ය ධර්මය නොදත්, එහි දක්ෂ නොවූ , ආර්ය ධර්මයෙහි නොහික්මුණු, එසේත්ම සත් පුරුෂ ධර්මයෙහි අදක්ෂ , අශ්‍රැතවත් පෘතග්ජනයා රූපය ආත්මය යැයි කියා හෝ ආත්මය රූපය යැයි කියා හෝ වරදවා ගනී. එනිසාම රූපය මගේ යැයි සිතයි, එනිසාම රූපය වෙනස් වෙන විට, විපරිනාමයට පත්වෙන විට ශෝක පරිදේවාදියට පත්වෙයි. වේදනා, සංඥා , සංඛාර , විඤ්ඤාණ පිළිබඳවද මෙසේ වරදවා සිතයි. ගෘහපතිය සත්‍යය සත්‍යය ලෙස වටහාගත නොහැකිව, අසත්‍ය සත්‍යය ලෙස වරදවා වටහා ගැනීම නිසා ඔහුගේ සිත ගිලන් වූවකි.



දුක් දොම්නස ඇතිවන්නේ එනිසයි. මෙහි ආර්යයන් යනුවෙන් දක්වෙන්නේ බුදු, පසේබුදු , මහරහතුන් වහන්සේලායි. උන්වහන්සේලා කෙලෙසුන්ගෙන් දුරුව පිරිසෙහි තම ඉරියව් නොසවත්වන , පැසසෙහි ඉරියව් පවත්වන, දෙවියන් සහිත ලෝකයේ නොඇලුණු සිතැතිව වෙන්ව වසන උතුමන් පිරිසකි. උන්වහන්සේලාගේ ධර්මය නිර්මලය, ප්‍රසන්නය, සත්‍යය එහි ධර්මය නොදත් එහි නොඇලුණු මහල්ලාගේ සිත රෝගී වූවකි.

"සප්පුරිස ධම්මා" යනුවෙන් සත්පුරුෂයින්ගේ ධර්මය පිළිබඳව මෙහි සඳහන් වෙයි, කල්‍යාණ මිත්‍රයා , සත්පුරුෂයා පිළිබඳව ධර්මයේ බොහෝ තැන්වල සඳහන් වෙයි.

"යොවෙ කතඤ්ඤු කතවෙදි ධීරො - කල්‍යාණ මිත්තො දළ්හ භත්තිච හොති
දුක්ඛිතස්ස සක්කච්ච කරොති කිච්චං - තථා විධං සප්පුරිසං වදන්ති"

මේ සත්පුරුෂයා හඳුනා ගැනීම සඳහා ඉදිරිපත්ව ඇති එක් දේශනාවකි. ඒ අනුව කළගුණ දැනීම , කළ උපකාරය දැනීම, ප්‍රඥාවන්තබව ඇති කල්‍යාණ මිත්‍ර වූ , දැඩි භක්තිය ඇති , දුකට පත්වූවන්ගේ කටයුතු මැනවින් ඉටු කරන තැනැත්තා සත්පුරුෂයෙකි. එයින් ප්‍රකට කෙරෙන්නේ ද බුදු පසේබුදු මහ රහතුන් වහන්සේලා මෙන්ම ලොව්තුරු ගුණවලින් සෝවාන්ව වන බුද්ධශ්‍රාවකයෝ ද සත්පුරුෂ ගණයෙහිලා සැලකෙන බවයි. සත්පුරුෂයින්ගේ ධර්මය කුමක්ද ප්‍රකාශ වෙන්නේ සත්‍යයයි. යථාර්ථයයි. එය මැනවින් අවබෝධ නොකරගන්නා ගේ සිත ගිලන්වූවකි.

"අරියානං අදස්සාවී සප්පුරිසානං අදස්සාවී" යැයි ආර්යයන්ගේ හා සත්පුරුෂයින්ගේ නොදැකීමද සිතේ ගිලන් බවට හේතුවේ යැයි මේ සූත්‍රයේ දක්වෙයි. දැකීම හෝ නොදැකීම තුළ දෙයාකාර සිදුවේ. එනම් දෙනෙතින් දැකීම හෝ නොදැකීම හා ප්‍රඥාවෙන් දැකීම හෝ නොදැකීමයි. මැසැසින් ආර්යයන් වහන්සේලා දැකීමෙන් උන්වහන්සේලාගේ වර්ණය හා හැඩය පමණක් දැකගත හැක. ගුණ මහිමය දැකගත නොහැක. අප පමණක් නොව සුනඛ, ගව ආදී සතුන්ද ආර්යයන් දෙනෙතින් දැක ඇත. එය ආර්ය දැකීමක් ලෙස නොසැලකේ. බුදු රජාණන් වහන්සේ දෙස බලා සිටි වක්කලි තෙරුන්ට මේ කුණු කය දෙස බලා සිටීමෙන් ඇති ඵලය කුමක්ද? යමෙක් මා දුටුවා යැයි වන්නේ ධර්මය දකීමෙනි. ධර්මය අවබෝධ කර ගැනීම තම මා දකිමක්යැයි ද වදාළේ පියවි ඇසින් දැකීම සැබෑ දැකීමක් නොවන නිසයි. වත්මන් බෞද්ධ සමාජයේ ද බොහෝ දෙනා ධර්මය හොඳින් දනිති. එහෙත් ප්‍රඥාවෙන් දැකීමට සමත් වී නැත. එනිසාම ධර්මයෙන් ලද හැකි ප්‍රතිඵල අහිමිව සිටිති. ධර්මය ප්‍රඥාවෙන් දුටු අය සසර දුක් නිමා කොට සද සැනසීම ලදහ. සියලු දුක් නැති කළහ.

ආර්ය ධර්මයේ අවිනීත බව ද සිත දුර්වලවීමට ලෙඩවීමට බලපාන සාධකයකි. විනයක් නැතිකම අවිනීතකමයි. "අරියධම්මෙ අවිනීතො" යැයි සඳහන් වන්නේ එබැවිනි. සංවර විනය හා ප්‍රහාන විනය යැයි විනය දෙකොටසකි. සංවර විනය නැවත සීල සංවර , සති සංවර, ඤාණ සංවර, ඛන්ති සංවර හා විරිය සංවරය යැයි පස් වැදෑරුම් වේ. සංවරය නම් හික්මීමයි. දමනය කර ගැනීමයි. ඇස කණ ආදී ඉන්ද්‍රියන් අපට වසඟ නැත. හිතුවක්කාර ඉඳුරන් වසඟ කරගත හැක්කේ මනා සිහියකින් යුතු අයෙකුට පමණි. සති සංවරය යනු ඇස කණ ආදී ඉඳුරන් සංවර කර ගැනීමයි. සීතල, උණුසුම ආදිය ඉවසීමට ඇති හැකියාව ඛන්ති සංවරයයි. නිරන්තරයෙන් හිතේ උපදින කාම විතර්කාදියට ඉඩ නොදී ඒවා වලක්වා ගෙන කටයුතු කිරීම වීර්ය සංවරයයි. අඥානයෙකුට ඉන්ද්‍රිය සංවරය ඇති කර ගැනීම පහසු නැත. එය කළ හැක්කේ ඥානවන්තයෙකුට පමණි. ඤාණ සංවරය නම් එයයි. මේ සියල්ල ඇතුළත් වෙන්නේ සංවර විනයටයි.

ප්‍රහීන කිරීම , ඉවත් කිරීම ප්‍රහානයයි. එය ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වෙයි. තදංග ප්‍රහාන , වික්ඛම්භන ප්‍රහාන හා සමුච්ඡේද ප්‍රහාන වශයෙනි. කාමච්ඡන්දාදී නීවරණ ධර්ම යහපතට ඇති මාර්ග වළකාලන පාප සහගත සිතිවිලියි. කුසලයක් කරනු ලබන තැනැත්තා එකී නීවරණ ධර්ම සමඟ සටනක යෙදීමක් කරයි. සටනින් කුසල සහගත සිතිවිල්ල ජය ලදොත් පමණක් කුසලය සිදු කෙරේ. එසේ සිදු කළ හැකි වන්නේ පාප සහගත සිතිවිලි පරාද කොට ප්‍රහානය කිරීමෙනි. කුසලයෙහි යෙදෙන අවස්ථාවේදී පමණක් තාවකාලිකව පරාද වන අවස්ථා තිබේ. යළි මතුවිය හැක. එය තදංග ප්‍රහානයයි. දියට දැමූ රබර් බෝලයක් අතින් තද කරගෙන සිටින තුරු දිය යට පවතින්නාක් මෙන් කුසලච්ඡන්දය වළකා ලන සිතිවිලි විරියෙන් යුතුව යම් කාලයක් තුළ වළකාලීම වික්ඛම්භන ප්‍රහානයයි. ඔතු දක්වන ලද අවිනය පැරජ්ජනයින් තුළ දකිය හැක. ගසක මුල් පවා සිඳ දමා මුළමනින්ම නැති කර දමන්නාසේ නැවත හට නොගන්නා සේ , මුළමනින්ම පාප සහගත සිතිවිලි සුන් කර දැමීම සමුච්ඡේද ප්‍රහානයයි. සැබැවින්ම ආර්යයන් හා සත්පුරුෂයින් දුටුවා යැයි දක්විය හැක්කේ මුළ මනින්ම කෙලෙස් නැති කළ තැනැත්තාටයි.

ආර්ය ධර්මය මැනවින් අවබෝධ නොකරගත් , සත්පුරුෂ ධර්මය වටහා නොගත් තැනැත්තා, ශිනිදල්ල හා එහි වර්ණය එකක්මැයි සලකන්නා සේ ආත්මය හා මම යනු එකක් යැයි සලකා, සක්කාය දෘෂ්ටි මත වශයෙන් ගෙන කටයුතු කිරීම නිසා දුක්ඛ දෝමනස්සයන් පැමිණේ. සිත ආතුරවීම නම් එයයි. කය දිරාපත් වීම, විනාශයට යාම වළකාලීමට කිසිවෙකුට නුපුළුවන. එහෙත් සිත කිසිදු නොවී, අවිසිදු නොවී පිරිසිදුව හා ශක්තිමත්ව පවත්වාගෙන යාම උත්සාහවන්තයාට කළ හැක. එවිට කයෙහි යථා ස්වභාවය පිළිබඳ මනා අවබෝධය ඇති බැවින් දුක්ඛ දෝමනස්ස උපායාසයන් ගෙන් තොර සැනසිලිදායක ජීවිතයක් ගත කිරීමට පුළුවන.

**පූජ්‍ය කොළවාසගන්දේ ඥානානන්ද හිමි**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේද, එබඳු පාප කර්ම නොකිරීම යහපත්ය."



# බුදුදහමට ලැබී ඇති නීතිමය බලය

මිහිඳු මාහිමියන් බුදුදහම හඳුන්වා දීමෙන් පසු ලාංකික සංස්කෘතිය හා නීති රීති ගොඩනැගුණේ බෞද්ධ සම්ප්‍රදාය අනුවය. අතීතයේ භික්ෂුවක් අගවිනිසුරු තනතුරද දැරුවේය. රජය හා බුද්ධාගම අතර පැවැති සබඳතාව ඇත්වුණේ ලංකාව බ්‍රිතාන්‍යයට යටත්වීමෙන් පසුවය. කෙසේ වුවද, 1815 ඉංග්‍රීසි-සිංහලේ ගිවිසුමෙහි 5 වන වගන්තිය මගින් බුද්ධාගම ආරක්ෂා කරන්නට බ්‍රිතාන්‍ය පාලකයෝ එකඟ වූහ.

1815 ගිවිසුමේ 5 වගන්තිය

"මෙකී රටවල්වල මුලාදෑනි සහ වැසියන් විසිනුද් අදහන්නා වූ බුද්ධ ශාසනයද දේවාගමද කඩ කළ නොහැකිව පවත්වා ගෙනට ඕනැවා සහ එහි කටයුතුද, සංඝයාද, විහාරස්ථානද දේවාලද පවත්වන්ඩ සහ ආරක්ෂා කරන්ඩත් ඕනැය."

1818 නොවැම්බර් 21 දිනැති බ්‍රිතාන්‍ය ස්වාධිපත්‍ය ප්‍රකාශනයේ 16 ප්‍රඥප්තියෙන්ද බුද්ධාගම හා භික්ෂූන් ආරක්ෂා කරන්නට ආණ්ඩුව බැඳී සිටින බව තවදුරටත් තහවුරු කොට ඇත. (16) බෞද්ධ භික්ෂූන්ට හා පූජනීයත්වලට යටගිය දවසේදී ලැබුණ ගෞරවය එසේම ලැබිය යුතු යැයි එහි දක්වේ. යටත් විජිත භාර මහලේකම් ජෝන් පැකින්ටන්ගේ 1852 දෙසැම්බර් 04 දිනැති ප්‍රකාශනයෙහි "අවශේෂ ජනයා විසින් ඉදිරිපත් කරනු ලබන කිසිම කරුණක් නිසා 1815 ගිවිසුම මගින් බෞද්ධාගමට සලසන බවට පොරොන්දු වූ වරප්‍රසාද හෝ ආරක්ෂාව ඉවත් කිරීමට මහරජතුමියගේ ආණ්ඩුවෙන් අවසර නොලැබේ" යනුවෙන් සඳහන් වෙයි. බුද්ධාගම හා බැඳුණ නෛතික අයිතීන් තහවුරු කෙරෙන 1815 ගිවිසුම හා 1818 බ්‍රිතාන්‍ය ස්වාධිපත්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 20 වන වෙළුමෙහි ඇතුළත් වෙයි. ඒ අනුව වර්තමාන නීතිය යටතේද එහි වලංගුභාවයක් පවතියි.

"පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම්කිසි නීතියක් මේ පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විධි විධානවලට අනුකූල නොවූවද, එකී සියලු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේය" යන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) අනුව්‍යවස්ථාව මගින් ඒ බව තහවුරු වෙයි. එයින් අදහස් වන්නේ කිසියම් නීතියක් ලිඛිතව නොතිබුණද සාම්ප්‍රදායික වශයෙන් පැවතෙන සිරිත් නීති පිළිගන්නා බවය. බෞද්ධ සිද්ධස්ථාන සම්බන්ධ චාරිත්‍ර හා සම්ප්‍රදායන්ට නීතිමය රක්ෂණය ලැබෙන්නේ එමගිනි.



"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව් වහා නොපෙනේ. එහෙත් අළු යට වූ ගිනි පුපුරක් මෙන් බාලයා දවමින් පසුපස ලුහු බඳී"



සුනාමි ව්‍යසනෙන් පසු බෞද්ධ පිරිසක් විසින් ත්‍රිකුණාමල නගරය මැද ඉදිකරගත් බුදුපිළිමය නීත්‍යනුකූල බව තහවුරු කිරීමේදී 1818 බ්‍රිතාන්‍ය ආධිපත්‍ය ප්‍රකාශනය මගින් ලබාදී ඇති නීතිමය ප්‍රතිපාදන අධිකරණයෙන් පිළිගැනුණි. 1815 ගිවිසුමේ නීත්‍යනුකූල තත්ත්වය අභියෝගයට ලක්වුණු විශේෂ අවස්ථාවක් වන්නේ 1915 වසරේදී ගම්පොළ වල්ලහගොඩ දේවාලයේ පෙරහැරට මුස්ලිම් පිරිසක් බාධා කිරීමේ සිද්ධියයි. පැරණි චාරිත්‍ර පවත්වාගෙන යාමට ගිවිසුමේ 5 වන වගන්තිය හා 1818 ප්‍රාධිපත්‍ය පිළිබඳ ප්‍රකාශනය අනුව බෞද්ධයන්ට අයිතියක් තිබෙන බව අධිකරණයේදී පිළිගෙන ඇත.

අතීතයේ සිට බුද්ධාගමට ලැබී තිබුණ අයිතිවාසිකම් 1946 ලංකා ආණ්ඩුක්‍රම රාජාඥාවේ 29 (2) වගන්තිය මගින් අහෝසි කරන ලදී. සර් අයිවර් ජෙනිංග්ස් මහතා සැකසූ එම ව්‍යවස්ථාවෙන් සියලු ආගම් සම තත්ත්වයකට පත් කොට තිබුණි. වෙනත් ආගමකට නොමැති විශේෂ තත්ත්වයක් එක් ආගමකට පමණක් ලබාදීමට නොහැකිය යන වගන්තිය ව්‍යවස්ථාවට ඇතුළත් කෙරුණි.

බුද්ධාගම ආරක්ෂා කිරීම සඳහා රජය නීතිමය වගකීමෙන් බැඳුණේ 1972 ජනරජ ව්‍යවස්ථාවෙනි. 1978 සම්මත වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වගන්තියෙන් බුද්ධාගමට සියලු ආගම් අතරින් ප්‍රමුඛස්ථානය පිරිනමා ඇත. එහි මෙසේ දැක්වෙයි.

9 වන වගන්තිය ශ්‍රී ලංකා ජනරජය විසින් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) (ඊ) වගන්තියට අනුව සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය.

ඒ අනුව පහත සඳහන් කරුණු ඉටු කිරීමට ශ්‍රී ලංකා රජය බැඳී සිටියි.

1. බුද්ධාගමට ප්‍රමුඛත්වය ලබාදීම
2. බුද්ධාගම ආරක්ෂා කිරීම
3. බුද්ධාගම පෝෂණය කිරීම.

ශ්‍රී ලංකා රජය කොළඹ නිදහස් චතුරශ්‍රයේ බෞද්ධ ධජය පමණක් ඔසවා තැබීම ව්‍යවස්ථානුකූල වුවකි.


බුද්ධාගමට ප්‍රමුඛස්ථානය හිමිවුවත්, බෞද්ධයන් තම ආගමික අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී අන් ආගමික පිරිසට හානියක් නොවන අයුරින් ක්‍රියා කිරීමට වගබලා ගත යුතුය. 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) (ඊ) වගන්තියට අනුව සියලුම ආගම්වලට පිරිනැමෙන පොදු අයිතිවාසිකම් තිබේ. ඒවාට හානියක් නොකළ යුතුය.

2000 වසරේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සඳහා යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ අතිගරු මහානායක හිමිවරු ඒ සඳහා සංශෝධනයක් ඉදිරිපත් කළහ. උන්වහන්සේලා රජයට යෝජනා කළේ, 'බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය යන යෙදුම වෙනුවට බුද්ධාගමට ප්‍රමුඛස්ථානය හිමිව ඇති බව පිළිගන්නේය' යනුවෙන් යොදන ලෙසය.

බුද්ධශාසනය යනු කුමක්ද? යන්න පිළිබඳව නිර්වචනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නොමැත. ඒ සඳහා විග්‍රහයක් 2002 බුද්ධ ශාසන කොමිසන් සභා වාර්තාවෙන් ඉදිරිපත් කොට ඇත. දැනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති බුද්ධශාසන පනතෙහි එය ඇතුළත් වෙයි. 'තථාගතයන් වහන්සේ, නවලෝකෝත්තර ධර්මය, පර්යාප්ති ධර්මය, සංඝරත්න, විහාරාංග සහිත විහාරස්ථාන, ආරණ්‍ය සේනාසන හා භාවනා මධ්‍යස්ථාන, බෝධිවෘක්ෂ, ස්තූප, පිළිම ගෙවල්, දාතු මන්දිර, ධර්මශාලා හා පුස්තකාල, උපෝසථාගාර, විහාරස්ථාන සන්තක ගොවිබිම් හා දේපොළ, බෞද්ධ අධ්‍යාපනය, දේවාලය, සිල් මාතාවන් හා උපාසිකාරාම, තෙරුවන් සරණ ගිය ගිහි ජනතාව, බෞද්ධ සාහිත්‍යය, සංස්කෘතිය හා ශිෂ්ටාචාරය, බෞද්ධාගමික උත්සව, පෙරහර හා පුද සිරිත්, බෞද්ධ ප්‍රතිපත්ති හා ආචාරධර්ම යන මේ අංග හා ඒවායේ පැවැත්මට අවශ්‍ය දෑ බුද්ධශාසනය තුළින් හැඳින්වෙනු ඇත.'

ඉහත සඳහන් සියලු දෑවල බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම පිළිබඳ රජයේ වගකීම වේ. බුද්ධ ශාසන පනත සම්මත වූ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය තවදුරටත් ශක්තිමත් වෙයි.


පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි
ගරු අනුශාසක : සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය



"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුලභ වූ පිහිටක් ලබන්නේය"

# රජුන්ට පමණක් නොව රටවැසි ජනතාවට ද යහපත ළඟා කරන දසරාජ ධර්ම





"දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං
අක්කොධං අවිහිංසඤ්ච ඛන්තිඤ්ච අවිරෝධනං"

දේශකයාණෝ : සියාමෝපාලි මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ
පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ
සුමංගල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පින්වත්නි,

අප ගෞතම සම්මා සම්බුද්ධරාජාණන්වහන්සේ සම්බුද්ධත්වයට පැමිණ නවවන මාසයේ දී ලක්දිව මහියංගණ මහානාග වනෝද්‍යානයට වැඩම කළ සේක. එහි වැඩම කොට ඒ වනට මලවත්ව සිටි කෙලෙස් බහින් මඩිත වූ හොඳුමුණු යක්ෂයන් දමනය කොට ගිරි දිවයිනට පිටත් කර යවා, ලක්දිව ශුද්ධ භූමියක් බවට පත් කළේ අද වන් දුරුතු පුන් පොහෝ දිනයකයි. මෙදින සෝවාන් වූ සුමන සමන් දිව්‍ය රාජයාට භාග්‍යවතුන්වහන්සේගේ සිරස පිරිමැද පිළිගැන්වූ කේශධාතූන්වහන්සේ, සමන් දෙවියන් විසින් රන් කරඬුවක බහා මහියංගණ චෛත්‍යය ස්ථාපනය කළේ ද මෙම පොහොය දිනයේදීමය. සිදුවූ අනුපෙළි ගැලී සිටි උරුවෙල් කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන තුන්බෑ ජටිලයන් ඇතුළු පිරිස දමනය කොට, ආදිත්තපරියාය සූත්‍ර දේශනාවෙන් ධර්ම දේශනා කොට සම්යක් දෘෂ්ටියෙහි පිහිටුවූයේ ද අදවැනි දුරුතු මැදි පොහෝ දිනකදීය. එසේම බිම්බිසාර රජතුමාට දුන් ප්‍රතිඥාව පරිදි බුදුබව ලබා නව වන මාසයේ දී පැවිදි වූ උරුවෙල් කාශ්‍යප ඇතුළු දහසක් පමණ රහතුන්වහන්සේ සමඟ රජගහ නුවරට වැඩම කළේ ද අද වැනි දිනකය. මෙසේ වැදගත් ශාසනික කටයුතු රාශියක් සිදු වූ දුරුතු පුන් පොහෝ දිනයේ දී දසරාජ ධර්මය මුල්කොට ධර්ම දේශනාවක් ඉදිරිපත් කිරීම සැම සියලු දෙනාගේම දෙලොව යහපත පිණිස හේතු වේ.

ඛුද්දක නිකායේ ජාතක පාලියෙහි, මහාහංස ජාතකයෙහි සඳහන් දානය, සීලය, පරිත්‍යාගය, ඍජු බව (අවංක බව), මෘදු ගතිය, උපෝසථසීලාදී තපස, මෛත්‍රිය පෙරදැරිකරගත් අක්‍රෝධය, කරුණාව මුල්කොට ගත් අවිහිංසාව, ඉවසීම මුල්කොට ගත් ක්ෂාන්තිය, එකඟ බව මුල්කොට ගත් අවිරෝධතාව යන දසරාජ ධර්මයන්ගෙන් යුක්ත වීම රජුන් හා අධිපති නායකයන්ට පමණක් නොව සැම සියලු දෙනාටම යහපත පිණිස හේතු වන ශ්‍රේෂ්ඨ පරමාර්ථ චර්යා ධර්ම පද්ධතියකි. දසරාජ ධර්මයේ දැක්වෙන්නා සතර සංග්‍රහ වස්තුවෙහි ද දැක්වෙනේ. රජුන් පමණක් නොව කිසියම් පිරිසක් පාලනය කරන නායකයන් වුවත් පිළිපැදිය යුතු ආචාර ධර්මයෝය. පුද්ගලයන් ගුණවත්, යහපත් වන තරමට සීලයෙන් වන තරමට ඒ ඒ පුද්ගලයාගේ ජීවිත පමණක් නොව මුළු රටම, ජාතියම යහපත ළඟා කරගත හැකිය. දසරාජ ධර්මයන්ට අනුව ජීවිත හැඩගස්වා ගැනීමෙන්, ප්‍රිය වචනයෙන්, පිරිසිදු හදවතින් යුතු, සැප බෙදාගැනීමෙන් සැට ප්‍රිය ද මෙලොව වශයෙන් විශාලාබර සැපවත් ජීවිතයක් ළඟා කරගත හැකිවෙනු නොඅනුමානය. දසරාජ ධර්මයෙහි සඳහන් දාන, සීලාදී මහාගෝ කරුණු රාජත්වයට පමණක් නොව බුද්ධත්වය වැනි උතුම් පදවියක් ලබාගැනීමට ද උපකාරී වේ.

මෙම ගුණධර්ම අනුගමනය කරන්නා නායකත්වය සොයා යා යුතු නැත. නිතැතින්ම නායකත්වය ඔහු සොයා එන බව වටහාගත යුතුය.

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනසිය යුතුය. නොනැසවිය යුතුය."

මෙකී ධර්මයන් මනාව පිළිපැදීමෙන් සිරිලෙස හැසිරිය හොත් මුළු රට ලංකාවක් සිරිසෙයි විසුව හොත් සක්විති රජ වන්නත් හැකියාව ඇත්තේය. ඒ අනුව දසරාජ ධර්මයන් අනුව ස්වකීය ජීවිත හැඩගස්වා ගැනීමට සදා සිටි පාලකයෝ උත්සුක වූහ. රජෙකුට හෝ කිසියම් ප්‍රධානියෙකුට හෝ ජනතාව දිනාගැනීමට නම් දැහැමි චර්යාව අත්‍යවශ්‍ය බව මුළු වදනයි.


දසපාරමී ධර්මයන්හි ද, සතර සංග්‍රහ වස්තුවෙහි ද ප්‍රධාන තැනක් ගන්නා දානය දසරාජ ධර්මයන්හි ද පළමුවැන්නයි. තමන් සතු සම්පත්, ධනය ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ හා ජනතාවගේ සුභසිද්ධිය සඳහා නිර්ලෝභීව දීම දානමයයි. දන් දීම, ආමිෂ දානය, අභය දානය, ධර්ම දානය යන කොටස්වලට බෙදේ. මින් පරිභෝජන වස්තු ආහාර පාන ආදිය දීම ආමිෂ දානයයි. අභය දානය යනු ජීවිත දානයයි. ධර්ම දානය යනු ධර්මය කියාදීම, දහම් පොතපත බෙදාදීම, ධර්මයේ චිරස්ථිතිය වෙනුවෙන් කටයුතු කිරීම ආදියයි. සාමකාමී සමාජයක් ඇතිකරලීමට දන්දීම අතා වැදගත් වන බව සූත්‍රදේශනා ග්‍රන්ථයන් ද විස්තර වේ. ආහාර නැති අයට ආහාරපාන ලබාදීම, ධනය ලබාදීම, ජල පහසුව සලසා දීම වැදගත් කොට සැලකේ. සත්වයා නැසවන් කිරීම අපේක්ෂාවෙන් අභය දානය දීම ද වැදගත් කොට සැලකේ. දානයන් අතුරෙන් ධර්ම දානය අන් සියලු දානයන්ට වඩා උතුම් වේ. දැහැමි සංකල්ප වර්ධනය කිරීමෙන් දැහැමි ජීවිත ඇතිකර ලීමෙන් රටේ ජනතාවගේ චිත්ත, හැදියාව, යහපත්කම වගා වේ. ඒ සඳහා ධර්ම දේශනා පැවැත්වීම නරපතියන්ට බොහෝ උපකාරී විය. ජනතාව යහමඟ ගී ගමන් කරවීමෙන් රජුට, රටේ සිටිය දැහැමිව ක්‍රියාත්මක කිරීමට පහසු වේ.

දසරාජ ධර්මයන්හි දෙවැන්න සීලයයි. සීලය යනු කාය, වාග් සංයමය හෙවත් සංවරයයි. පස්පවින්, දස අකුසලින් වැළකී මෙත්සිතින් කටයුතු කිරීම සීල ගුණයෙන් අපේක්ෂිතය. බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය සරණ කොට පරපණ නැසීමෙන් මිදීම, අන්සතු දේ සොර සිතින් නොගැනීම, පර මිරාගමනයේ නොයෙදීම, මුසාබස් නොකීම, මත්පැන් නොබීම යන පංචසීල ප්‍රතිපත්තිය මැනවින් රකින්නා, සිහි ඇතිව දෙපක්ෂයෙම ප්‍රසාදයට පත් වේ. සක්විති රජවරු පවා ධර්මය ඇසුරු කොට, සීලය මැනවින් රකිති. එසේ දැහැමි වූ බිඳුනාට සියලු සියලු සතුන් දිනිය හැකිය. එවැනි සක්විති රජවරුන්ට චක්‍රරත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය වැනි සත්රුවන් රත්නයන් ද පහළ වේ.

දසරාජ ධර්මයන්හි තුන්වැන්න පරිත්‍යාග යයි. තමන් සතු සම්පත්, ධනය ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මෙන්ම ජනතාවට අනලස්ව පරිත්‍යාග කිරීම යහපත් පාලකයන්ගේ මෙන්ම අවශේෂ නායකයන්ගේ ද සිරිත විය. පුත්‍ර බුද්ධියෙන් හා අනුපුත්‍ර බුද්ධියෙන් සිදුකරන පරිත්‍යාගයන් නම් කාණ්ඩ දුෂ්කර ගන්නා රජු හෝ නායකයා කෙරෙහි පරිත්‍යාගය ලබන්නාගේ සිත්හි ද කරුණාව, මෛත්‍රිය උපදී.

දසරාජ ධර්මයන්හි සිව්වෙනිව දක්වා ලැබෙන ඍජු බව පාලකයන් තුළ මෙන්ම අන් සැමදෙනා තුළම තිබිය යුතු උසස් ගුණාංග යකි. බියෙන් හෝ ඡන්දයෙන් අගතියට නොගොස්, මැදහත් සිතින් කටයුතු කිරීම ඍජු ගුණයයි. අතීත රජවරු ඍජු ගුණයෙහි පිහිටා කටයුතු කළේ මුළු දහමෙන් උපන් අභ්‍යාසය නිසාය. අපක්ෂපාතී ඍජු ප්‍රතිපත්ති අනුව මහය කරන්නේ නම් රටේ යහපත මෙන්ම පාලනයේ පහසුව ද එහෙයේ ඇතිවිය හැක. සාමාන්‍ය අයට පවා ඍජු ප්‍රතිපත්තියෙහි පිහිටා කටයුතු කිරීමෙන් යහපතක් ලද හැකිය.

මෘදු ස්වභාවය දසරාජ ධර්මයන්හි එන පස්වන් වැදගත් ගුණාංගයකි. නායකයා දරුණු ලෙස කටයුතු කරන්නේ නම් ජනතාවගේ විශ්වාසය බිඳී ගොස් ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ප්‍රතිවාද දක්වන පරිසරයක් අවසාන නිර්මාණය වේ. අන්තවාදීව නම් මතවාදයන් ක්‍රියාත්මක කිරීමට යාමෙන් සිදුවන්නේ යහපතට වඩා හරසය. එබැවින් සං තුළත් මෘදු ස්වභාවය ඇතිකර ගැනීම යහපත



පිණිසම හේතු වන්නේය.

උත්සාහයෙන් දී සීලයේ පිහිටා තපස්වීව ඇතිකර ගැනීම නායකයන් තුළ පමණක් නොව සැම සියලු දෙනා වෙතම තිබිය යුතු දසරාජ ධර්මයන්ට අයත් ගුණාංගයක් වන්නේය. යහපත් ආත්ම සංවරය ඇතිකර ගැනීම, ඉන්ද්‍රියන් දමනය කරගැනීම තපස නමින් හැඳින්වේ. ඉන්ද්‍රිය දමනය වනාහි සැම නායකයෙකු තුළම අනිවාර්යයෙන්ම තිබිය යුතු ගුණාංගයකි. අධික ලෙස ඉන්ද්‍රියන් පිනවීමට යාමෙන් රටේ ජනතාවගේ පක්ෂපාතීත්වය නැති වී රාජ්‍යයේ සම්ප්‍රදායට ද හානි පැමිණවිය හැකිය. යහපත් පෞරුෂයක් ගොඩනගා නොගත් විට පිරිහීම අත ළඟය. අධික ලෙස ඉන්ද්‍රිය පිනවීමට ගොස් සුනඛයෙම් රජු රාජ්‍යයෙන් පිරිහුණු අයුරුව ජාතකයෙන් මනාව විවරණය හැකිය.

මෛත්‍රිය පෙරටු කොට ගත් අක්‍රෝධී බව දසරාජ ධර්මයන්හි එන හත්වන් ගුණාංගයකි. ජනතාව තුළත්, නායකයා තුළත් කල්‍යාණ මිත්‍ර සම්බන්ධතා ගොඩනැගුණු විට, එකිනෙකාට මෛත්‍රී සිත පහළවීමෙන් දුක සැප බෙදාගැනීමට ක්‍රියා කළ විට සමූහයාගේ අතර විශ්වාසය තහවුරු වේ. ක්‍රෝධ සිතින් ගන්නා තීරණ කිසිවිටෙක සාර්ථක නොවේ. එබැවින් තමන් තුළ මෛත්‍රී පූර්වක අක්‍රෝධී බව ඇතිකර ගැනීම දෙලොව යහපත පිණිසම හේතුවේ.


කරුණාව පෙරදැරිකරගත් අවිහිංසාව දසරාජ ධර්මයන්හි අටවැන්නයි. එය රටක පාලකයන් හා පාලිතයන් යන දෙපක්ෂය අතරම තිබිය යුතු වැදගත් ගුණාංගයකි. මේ දෙපක්ෂයම හිංසක ක්‍රියාවන්ගෙන් මිදිය යුතුය. අවිහිංසාවාදීව ක්‍රියාකළ අතීත නරපතීන්ගෙන් අප රටට යහපතක් සිදුවිය. අවිහිංසාව වඩා වර්ධනය කරගැනීමට නම් කරුණා සිත දියුණු කළ යුතුය.

ඉවසීම හෙවත් ක්ෂාන්තිය දසරාජ ධර්මයන්ට අදාළ නවවන් ගුණාංගයකි. ඉවසීමෙන් තොරව තීරණ ගෙන කටයුතු කිරීමෙන් පෞද්ගලිකව තමන්ගේ පමණක් නොව මුළු රටේම කටයුතු අවුලක් බවට පත්වේ. ඉවසීමෙන් තොරව කටයුතු කිරීමෙන් පෞද්ගලික වශයෙනුත්, පොදු වශයෙනුත් සිදුවිය හැකි හානිය පිරිහෙ නොහෙය. එබැවින් ඉවසීමෙන් යුතුව කටයුතු කිරීමෙන් මෙලොව, පරලොව උභය ලෝකාර්ථ සිද්ධියම සාධනය කරගැනීමට වෑයම් කළ යුතුය.

එකඟතාව හෙවත් අවිරෝධිතාව දසරාජ ධර්මයන්හි එන දසවන් වැදගත් ගුණාංගයක් වන්නේය. අවිරෝධිතාව යනු නොගැටී සිටීමට ඇති හැකියාවයි. විරුද්ධ අදහස් ඇති අය සමඟ නොගැටී තම මතය වෙත අනෙක් අය නැඹුරු කරවා ගැනීමට උත්සුක විය හැකිනම් එය දක්ෂ ක්‍රියාවක් වන්නේය.

මහාහංස ජාතක කථාවෙහි සඳහන් වන ධතරට්ඨ නම් හංස මහරජුව උපන් අප මහබෝධිසත්වයෝත්, සුමුඛ නම් හංස සෙනෙවිව උපන් අනඳ මහතෙරණුවෝත්, ඛේමා දේවියටත් පසුව නොමිව බරණැස් නුවර කසී රට අධිපති මහරජු වෙත ඉදිරිපත් කරන ලදී. එම අවස්ථාවේ ඇති වූ පිළිසඳර කථාවේ දී හෙළි වූ දසරාජ ධර්මයන් රජුන්ට පමණක් නොව සාමාන්‍ය නායකයන්ට ද අන් සියලු දෙනාට ද එක සේ වැදගත් වන උසස් ගුණධර්ම දසයකි. දන්දීම, සිල් රැකීම, පරිත්‍යාගය, ඍජු බවය, මෘදු බවය, උපෝෂථ සීල දී තපසය, මෛත්‍රී පූර්වක අක්‍රෝධය, කරුණා පූර්වක අවිහිංසාවය, ඉවසීමය, අවිරෝධිතාවය යන මේ උතුම් දසරාජ ධර්මයන් ස්වකීය ජීවිතයෙහිලා පුරුදු පුහුණු කරගැනීමෙන් මෙලොව පරලොව දෙකම ජයගත හැකිය.

තෙරුවන් සරණයි.



# උපන් දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ

**ඓතිහාසික කැලණිය රජමහා විහාරයේ දුරුතු මහා පෙරහර මංගල්‍යය ජනවාරි 14 වැනි දින නිමාවට පත්විය. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**


• •

බුදු සසුන ලද පූජනීය කැලණිය පුදබිම ගැන සිහිවෙන හැම වාරයකදීම වාගේ සිතේ උපදින සිතුවිල්ලක් වේ.

"උපන් ද සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ" යන එම රමණීය සිතුවිල්ල කවදා, කෙලෙස උපන් එකක්දැයි කිව නොහැකි වුවද ඒ සිතුවිල්ල නිසාම කැලණිය පුදබිම ගැන බෞද්ධ ජනයාගේ සිත් සතන් තුළ උපදින බුදු බැතිය අප්‍රමාණය. අද උදාවූ දුරුතු පුන් පොහෝ දින කැලණිය රජමහා විහාර භූමිය බෞද්ධ සැදැහැවතුන්ගෙන් මේ වනවිටත් පිරී ඉතිරී ගොස් හමාරය. දිවයිනේ සිව්දිගින් කැලණිය විහාරය වඳින්නට එන ජනතාව අන් දිනවලට වඩා දුරුතු පොහොද අති විශාලය. අලි ඇතුන් සහිත දර්ශනීය දුරුතු මහා පෙරහර මෙදින විථි සංචාරය කරන නිසාද දුරුතු මහට කැලණිය පුද බිම් තව තවත් ජනාකීර්ණ වෙයි.

කැලණිය පුරාවෘත ගැන විමසා බලන විටදී එය පන්සිය පනස් ජාතක පොතේ එන වලාහස්ස ජාතකය තෙක් ඈත අතීතයට දිව යයි. එම කතාවේ සිරිලක බටහිර වෙරළෙහි වූ 'කල්‍යාණි' නම් වෙළෙඳ නගරයක් ගැන සඳහන් වේ. [illegible] අපර මධ්‍යම ඉන්දියාවේ 'කල්‍යාණි' ප්‍රදේශයෙන් සංක්‍රමණය වූ ආර්ය පිරිසකගෙන් කැලණි ප්‍රදේශය ජනාවාස වන්නට ඇතැයි සමහර විද්වත්හු ප්‍රකාශ කොට තිබේ. කැලණිය නාගගෝත්‍රිකයන් ප්‍රබල වාසස්ථානයක්ව පැවති බව තවත් මතයකි. ඒ බව "විෂ්ණු පුරාණ" ආදී ග්‍රන්ථවලද සඳහන් වේ. රාවණ පැරදූ රාම විසින් කැලණි පුරවරය විභීෂණට පැවරූ බවටද මතයක් තිබේ. බෝධිවංශය හා දඹදෙණි අස්න වැනි පැරණි බෞද්ධ ග්‍රන්ථවල කැලණිය හඳුන්වා දී ඇත්තේ 'කල්‍යාණි දේශ' යන නාමයෙනි. මේ අනුව එවකට කැලණිය ඉතා ප්‍රසිද්ධ නගරයක්ව පැවති බවට අපට අනුමාන කළ හැකිය. එවකට මායා රටේ ප්‍රධාන පුදබිමද කැලණිය විය.

බුදුන්වහන්සේ රහතන් වහන්සේලා 500ක් සමග වෙසක් පුන් පොහෝ දිනක කැලණිය පුදබිමට වැඩම කළ බව පැරණි මූලාශ්‍රවල සඳහන් වේ. මිණි පලඟක් අරබයා චූලෝදර-මහෝදර දෙදෙනා නාගදීපයේ කළ සටනේදී එය විසඳීම සඳහා "මණිඅක්ඛිත" නා රජුගේ ආරාධනයෙන් බුදුන් වහන්සේ මෙහි



"යමෙක් මුලදී පමා වූවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

වැඩම කොට ඇත්තාහ. එම ගමනේදී බුදුන් වහන්සේ දහම් දෙසූ ස්ථානය සිහි කිරීම සඳහා යටාලතිස්ස රජු විසින් ක්‍රි. පූර්ව 3 සියවසේදී හැඩිරියන් උසට කල්‍යාණි චෛත්‍යය ඉදිකොට තිබේ.

කැලණි විභීෂණ දේවාල ශෛල ලිපියේද බුදුන්ගේ ධාතු නිධන් කළ මහා ස්ථූපයක් ගැන සඳහන් වෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පෙන්වා දී ඇත. එසේම රාහුල හිමියන්ගේ සැලලිහිණි සංදේශයේ එන මේ අපූරු කවියෙන්ද හැඟී යන්නේ බුදුන් වහන්සේ දිය හා එම ස්ථානයේ වැඩ සිටි බවය.

"සමනොළ ගිරි හිඳිදු දිගු කළ සොඳෙනු   සැටි
සිහිලඳ ගඟු සිළිල් සනහා මුනි නො   ගැටි
පැහැදුණ තුන් සිඹුරු ඇඳ පෙර වැ වැඩ   සිටි
නැන කළ සිඹුරු දුගැබ වඳ නොසා   සිටි"

කැලණි රජමහා විහාරයේ සත්මහල් ප්‍රාසාදයක් යටාලතිස්ස රජු විසින් ඉදිකළ බවට තොරතුරුද මහා වංශයේ සඳහන් වේ. නිර්දෝෂී රහත් තෙර නමක් සැක කොට උණු තෙල් සැලියක දමා මැරීමේ සංවේගජනක සිද්ධියක් ගැනද එහි විස්තර දක්වා තිබේ. මේ පාපය නිසා එද මහ මුහුද ගොඩ ගලන්නට සිදුවූ ඒ ඉතිහාස පුවත අපි බොහෝ දෙනා අසා ඇත්තෙමු. ඒ විපතින් රට බේරා ගැනීම පිණිස "දේවී" නම් කුමරිය යාත්‍රාවක දමා මුහුදේ පාකර හැරිය බව එම මූලාශ්‍රවල වැඩිදුරටත් සඳහන් වේ. කාවන්තිස්ස රජුගේ අග මෙහෙසිය බවට පත්වූයේ මේ දේවී කුමරියයි. ඇය පසුව විහාරමහාදේවී කුමරිය නමින් ප්‍රසිද්ධ වූවාය.

එළාර රජු පරදවා ශ්‍රී සිංහලය එක්සේසත් කළ දුටුගැමුණු රජතුමාගේ (ක්‍රි.පූ. 161-137) කාලය තුළ කැලණි විහාරයේ පන්සීයක් පමණ භික්ෂූන් වහන්සේලා වැඩ සිටි බවද පැරණි මූලාශ්‍ර පෙන්වා දෙයි. දෙවන පැරකුම්බා රජතුමාද කැලණි විහාරයේ දියුණුවට විශාල සේවයක් සැලසූ බව පූජාවලියේ හා මහාවංශයේ සඳහන් වේ. කැලණි පුදබිම පිළිසකර කරන ලද රජවරුන් අතර නිශ්ශංකමල්ල, කිත්සිරි මෙවන්, තුන්වන විජයබාහු හා තුන්වන වික්‍රමබාහු කැපී පෙනේ.


කැලණිය පුදබිම ගැන පුරාණ සාහිත්‍ය කෘතිවලද බොහෝ විසිතුරු වර්ණනා දක්වා තිබීම විශේෂ කොට දක්විය හැකිය. තිසර, මයුර, සැලලිහිණි, කෝකිල හා හංස සංදේශ ඒ අතරින් කැපී පෙනේ. කැලණි පුරවරයේ එද පැවති ශ්‍රී විභූතිය එම කෘතිවල කතුවරයින් වර්ණනා කර ඇති අපූරු මෙහෙවින් සිත්ගන්නා සුළුය.

කෙසේ වෙතත් 1505 දී පෘතුගීසීන් මෙරට ආක්‍රමණය කිරීමත් සමගම කැලණි පුදබිමේ පරිහානිය ආරම්භ විය. ලන්දේසි යුගයේදී කැලණියට අයත් වූයේ එම ශෝකජනක ඉරණමය. කැලණිය නැවත පුනර්ජීවයක් ලබන්නේ 1747 වසරේදීය. කන්ද උඩරට විසූ කීර්ති ශ්‍රී රාජසිංහ රජු නැවත කැලණිය පුදබිම සිරිලක ඇති පූජනීය ස්ථානයක් බවට පත් කරන්නට විපුල සේවාවක් සිදු කළේය.

ධාන්‍යාකාරව ගොඩනගන ලද මෙම අලංකාර පූජනීය කැලණි දාගැබ අඩි 90 ක් පමණ උසය. සොළොස් මහා ස්ථානයට අයත් මෙම පූජනීය කැලණි ස්ථානයේ අප වන්දනාමාන කළ හැකි පූජනීය තැන් බොහෝය. ඒවා නම් ලක්තිලක චෛත්‍යය, සල පිළිමය, සමාධි පිළිමය, සිවුරු දාගැබයි. වර්තමානය වන විට කැලණිය රජමහා විහාරය හා ඒ අවට භූමි ප්‍රදේශය ඉතා රමණීය ලෙස අභිනවයෙන් නිර්මාණය කොට තිබේ. එහි මූලිකත්වය ගෙන කටයුතු කරන විහාරාධිපති පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද ස්වාමීන් වහන්සේ කැලණිය විහාරය සිරිලක පිහිටි අතිපූජනීය හා වන්දනීය පුදබිමක් බවට පත්කරන්නට දරන වෙහෙස අපමණය. එද අපේ ජනකවියා සුන්දර කැලණි පුරවරය දුටු අපූරු සඳහන් කරමින් මෙම ලිපිය අවසන් කරමි.

"පසන් ගවිතම මුනිඳු බුදු වී සාසනේ ලොව පැවති   සේ
වසන් පත් ඇති අයත් මරුවා කැටිව යනවා උරු   දිනේ
වසන් ඇති ද සරපු හිත මිය කැටුව යන්නේ පැනැ   දිනේ
උපන් ද සිට කරපු පව් නැත මරන් වැන්දෙන්   කැලණියේ"

ගීත් ගුණසේකර



"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ"




# මරණයකදී හඬා වැටෙමුද?

## මතරෝදන ජාතකය කියවා තීරණයකට එළඹෙමු


තුන්ලොවක් සතහා වදාළ අපගේ බුදුපියාණන් වහන්සේ මෙදින වැඩ වාසය කරනු ලැබුවේ සියලු අලංකාරයන්ගෙන් සමන්විත වූ දෙව්රම් මහා විහාරයේය. උන්වහන්සේ මේ ජාතක කතාව වදාළේ එක් ගහ පුත්‍රයකු මුල්කරගෙනය. සැවැත්නුවර වාසය කළ මොහුගේ මියගිය එකම සහෝදරයා වෙනුවෙන් සියලු කැප පහසුකම්වලින් ඉවත්ව නොකා, නොබී දුකෙන් කාලය ගත කළේය. දිනපතා උදය, සවස සොහොනට ගොසින් හඬා වැළපුණේය.

දිනක් අපේ බුදුපියාණන් වහන්සේ අලුයම් වේලෙහි පතල මහා කරුණාවෙන් බුදු නුවණින් ලෝකය දෙස බැලුවේ, අද මා කවුරුන් හට පිහිට වන්නේදැයි කියාය. සොහොනෙහි හඬා වැළපෙමින් සිටින මේ සිටු පුත්‍රයාට මාර්ගඵල ලබා ගැනීමට තරම් පින් බලයක් ඇති බව බුදුන්ට දක්නට ලැබිණි. දෙවැනි දවසේ හවස් වරුවේ උන්වහන්සේ සිටු පුත්‍රයාගේ නිවසට වැඩම කළහ. ඒ බව දැනගත් ඔහු මහත් ගෞරවාදරයෙන් යුතුව බුදුරදුන් සිටු මැදුර තුළට වැඩමවා බුද්ධාසනයක් පනවා වැඩ සිටින්නට ආරාධනා කර සිටියේය.

බුදුරදුන් එම සිටු පුත්‍රයාට කතා කොට, කොප ශෝකයෙන් පසු වන්නේද? විමසා සිටියහ. ඒ ඇසූ තරුණ සිටු පුත්‍රයා "බුදුහාමුදුරුවනේ.... මගේ සහෝදරයා මළ



"වෛරය සහිතව ජීවත් වන මිනිසුන් අතුරෙහි වෛර රහිතව ඒකාන්තයෙන්ම සුවසේ ජීවත් වෙමු. වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වෙමු."



ශෝකයෙන් පසුවෙමි'' යි කියා සිටියේය. සිටු පුත්‍රයාගේ දුකට හේතුව අසා, ''සිටු පුත්‍රය, මේ ලෝකයෙහි පවතින කිසිවකු හෝ කිසිවක් ස්ථිර නොවේ. අපට හිමිව ඇති මේ ශරීරය ලෙඩ රෝගවලින් පිරුණු, ජරාවට පත්වෙන, මරණයෙන් කෙළවර වන්නකි. පෙර නුවණින් විමසා බැලූ පණ්ඩිත ජනයන් තමන්ගේ සහෝදරයකු මළ කල්හි සිතුවේ මෙලෙසය. ''බිඳෙන සුළු වූ සියලු දේ බිඳෙන්නේය, නැසෙන සුළු යමක් ඇද්ද නැසී යන්නේය. එවැනි සියලු දෙයෙහි අස්ථිර බවම සලකා ශෝක නොකළේය'' යැයි වදාළ උන්වහන්සේ නිහඬව වැඩ සිටියහ. ඒ ඇසූ සිටු පුත්‍රයා ඒ අතීත සිදුවීම ගැන විස්තර දැන ගන්නා කැමැත්තෙන් බුදුරදුන්ට ආරාධනා කර සිටියේය.

මහා කාරුණිකයාණන් වහන්සේ මේ ලෙස පිළිවෙළින් කතාව විස්තර කොට වදාළහ. පෙර බරණැස් නුවර රාජ්‍ය කළේ බ්‍රහ්මදත්ත නම් රජතුමාය. බුදුවෙන්න පෙරුම් පිරූ අපේ බෝධිසත්වයන් අසූ කෝටියක් ධන සම්පත්වලින් පිරී සිටු මැදුරක උපත ලැබ සිටියහ. මව්, පිය දෙදෙනා මියගියාට පසු බෝසත් සිටු පුත්‍රයාට සිටු තනතුර හිමිවිය. තම සහෝදරයෙක් සමග කාලයක් වසන අතරතුර, හදිසියේම සහෝදරයා මියගියේය. නෑදෑ හිතමිත්‍රයින් ආදී සියල්ලන්ම දුක් වේදනාවෙන් හඬා වැළපෙන්න ගත්හ. ඒ වෙලාවේ කිසිවෙකුට දුක් නොවී සිටින්නට පුළුවන්කමක් තිබුණේද නැත. එසේ වුවත් බෝසත් සිටු පුත්‍රයා හැඬීමක්, වැළපීමක් කළේ නැත. විලාප දුන්නේද නැත. මුහුණෙහි පවා කිසිදු වෙනසක් තිබුණේ නැත. රැස්ව සිටි පිරිසට මෙය පුදුමයට කාරණයක් විය. එකිනෙකා කතා කළේ මෙන්න මේ ආකාරයටය. ''බලන්න අර සිටු පුත්‍රයා දෙස. හරිම නපුරු ගතිගුණ ඇති මිනිසෙක්. සහෝදරයාගේ ධන සම්පත් රැගෙන සැපසේ ජීවත් වන්නයි ඔය හදන්නේ.''

එම වදන් අසා සිටි සිටු පුත්‍රයා,

''ඔබ හැම දෙනාම නුවණ මදකමින් ලාභ අලාභ, නින්ද ප්‍රශංසා, යස අයස, දුක සැප යන අටලෝ දහම ගැන දනීද? එය සියලු සත්වයන්ටම පොදු වූවකි. මගේ සහෝදරයා මළේය. මමද ඒකාන්තයෙන්ම මිය යන්නේය. නොප සියල්ලන්ද මිය යනු ලබන්නේය. තමන් මරණයට පත්වීම නිසා හඬා වැළපෙනු මිස, අනුන්ගේ මරණය නිසා හැඬීමට කාරණයක් නැත. අටලෝ දහම ගැන හොඳින් දන්නා මා කුමට හඬන්නද? මේ ලෝකයෙහි අපි සියල්ලෝම එකිනෙකා පසු පස පැමිණ මරණයට පත් වන්නේය.

ඒ විතරක් නොවේ. දිව්‍ය සැප ලබන සියලු දෙවියන්ද, සක්විති රජකම දරන රජ දරුවන්ද, සිංහ, ව්‍යාඝ්‍ර, හස්ති ආදී බලවත් සිවුපා සතුන්ද, මහා බලැති ගරුඩරාජා ආදී අනේක විධ පක්ෂීන්ද, උග්‍ර විෂ තේජස් ඇති වාසුකී, මහාකාලාදී සර්ප රාජයන්ද, පාද නැති, පාද දෙකක් ඇති, පාද සතරක් ඇති, බොහෝ පාද ඇති සියලු සත්වයන්ම මිය යන්නේය. තම යස ඉසුරුවලට මහත් ලෝබයෙන් යමක් දෙන්නේද, ඒවට ඇති ආසාවන් අතහැර මිය නොයන්නේය.

> ''සිටු පුත්‍රය... මේ ලෝකයෙහි පවතින කිසිවකු හෝ කිසිවක් ස්ථිර නොවේ. අපට හිමිව ඇති මේ ශරීරය ලෙඩ රෝගවලින් පිරුණු, ජරාවට පත්වෙන, මරණයෙන් කෙළවර වන්නකි.''

මෙලෙස කාම, රූප, අරූප යන තුන්ලොවේම වාසය කරන සත්වයන්, ඒකාන්තව සැප දුක් නොවිඳිති. රෝදයක් සේ කරකැවෙමින් ඒ දුක සැප සෙලවෙමින්, පෙරළී යන්නේය. මේ සියල්ල නුවණින් අවබෝධ කොට ගන්නා පණ්ඩිතයන්, හැඬීම, වැළපීම නිෂ්ඵල යැයි දන්නේය. එමෙන්ම ස්ත්‍රීන්ට ලොල්වීම, සුරාවෙහි ඇලීම, දූ කෙළියෙහි නිරතවීම, නුවණින් විමසා නොබලයිද, කෙලෙස් සතුරන් ජය නොගනිද, ධර්මය අධර්මය ගැන කල්පනා නොකර, හුස්ම ගැනීමෙන් පමණක් ජීවත් වෙන ලාමක මිනිසුන් තම ඥාතීන්ගේ කරදරයකදී හඬා වැළපෙයි. නුවණින් යුක්ත නොහඬනා අය දැක, මෝඩ මිනිසුන් බැණ වදියි. අපහාස කරයි. නුවණැත්තන් අටලෝ දහම නියම අයුරින් දැන ශෝකය දුරු කරයි.''

බුදුපියාණන් වහන්සේ මෙසේ ඒ අතීත කතාව විස්තර කර, චතුරාර්ය සත්‍ය දේශනාව අවසානයේ සිටුපුත්‍රයා සෝවාන් ඵලයට පත්කළහ. එදා හඬන වැළපෙන ජනයා තුළ පැවති ශෝකය දුරු කළ සිටු පුත්‍රයා නම් බුදු වූ මමම යැයි වදාළහ.

**වජිර දයාවංශ**



# වඩා හොඳ ආමිස ප්‍රතිපත්ති පූජාවද?



බුදුන් වහන්සේගේ ශාන්ත වූ ශෝභන රූපය දෙසම ආදර භක්තියෙන් බලාගෙන හුන් වක්කලී තෙරුනට "වක්කලිය.... මේ ලේ මස් ආදියෙන් පැදී ඇති කුණු සිරුරක් දෙස බලාගෙන ඉඳීමෙන් ඇති වැඩේ කුමක්ද? මේ තැන නොඉඳ යන්න. ගොහින් ධර්මකාය දෙස බලන්න. ධර්මකාය දක්නා තැනැත්තා මා දකිනැ" යි වදාළ සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගෙන් අපේක්ෂා කළේ ප්‍රතිපත්ති පූජාවය.

ගිහිගෙයි වසන හැම දෙනාට භික්ෂුවට තරම් ඉහළ පිළිවෙත් පිරීම අමාරුය. එබැවින් ඔවුන් ගත යුතු මග විදාරන සේක්. "ගිහි පටිපද සූත්‍ර සූත්‍ර" ආදියෙන් යටත් පිරිසෙයින් පන්සිල්වත් රකිමින් දන්දීම ආදී ආමිස පූජාවන්ගේ මගින් සන්තානය හැකිතරම් දුරට ලෝභාදියෙන් ඈත් කොට අලෝභාදියෙන් ඈත් කොට අලෝභාදී සද්ගුණ පක්ෂය වඩාලන හැටි උගන්වා වදාළ සේක.

සමහරු තමන්ගේ භක්තිය පිරිදී දහස් ගණන් පහන් පූජා කරති. බොහෝ වියදම් කෙරෙමින් පුද පෙරහැරවල් පවත්වති. බෝධි පූජාවන් කරති. මේවා හිස් වැඩ නොවේ දැයි ඇතැමුන් ප්‍රශ්න කරති.

පාඨශාලාවක බාලාංශයේ සිට විද්‍යාව ඉගැන්වෙන ඉහළම පන්තිය තෙක්ම පන්ති ඇතැයි සිතමු. බාලාංශයේ සිසුවන්ද පුහුණු කරවන්නේ මතු කිසි දවසෙක ඉහළම පන්තියේ ඉගැන්වීම ලබන්නට සුදුස්සන් කිරීමටය. එහෙත් දවසෙකින් දෙකකින් එය කළ නොහැක්කෙකි. ඔවුනට එයට සුදුසු දැනුම ලැබෙන තෙක් ක්‍රමයෙන් ඉගැන්විය යුතුය. එහෙත් බාලාංශයේ සිසුවනට,

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අතිසතු යමෙක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කාරණයෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



ඔවුන්ගේ වයසට නුවණට සරිලන පරිදි චිත්‍ර මඟින් කෙළිබඩු මඟින් ක්‍රීඩා මාර්ග යෙන් අකුරු කියවන්නට, වචන කියවන්නට ඉගැන්විය යුතුය. ඔවුනට ඉහළම පන්තියට ඉගැන්වෙන විද්‍යා පාඩම් ඉහළ ගණිතය උගන්වන්නට හැරසුණොත් එහෙම පිටින් ම එය නිෂ්ඵල පිස්සු විකාරයක් වෙයි.


මෙසේම ලෝක නමැති පාසලේ ආධ්‍යාත්මික අභිවෘද්ධිය අතින් තරමක් ඉහළට ගිය අයද, ඉතාම පහළ අයද වෙති. ඒ ආධ්‍යාත්මික ගුණ විකාසයෙන් ඉහළ නොගිය පහතම පන්තියේ වූ අයට ඉහළ පිළිවෙත් පිරුම් තබා පස් පවෙන් වැළකීමේ අදහස කිමෙක් දැයි වැටැහීමෙකුදු නැත. ඔවුහු පාසලක බාලාංශයේ දරුවන් බඳුය. එහෙත් ඔවුන් අත් නොහැරිය යුතුය. මිනිසුන් ගැන කියනු කිම තිරිසනකු වුවද යම් නම් හොඳ අතකට පැමිණ විය හැකි නම් එය කළ යුතුය. භාග්‍යවතුන් වහන්සේ ඇතකුටත්, වඳුරෙකුටවත් වන යහපත දැක පාරිලෙය්‍ය වනයේ විසූ පුවත හොඳ නිදසුනකි.

කරුණු මෙසේ බැවින් ආධ්‍යාත්මික ගුණ අතින් ඉහළ නොගිය සාමාන්‍ය බහුතර ජනතාවට මහා සඟන් පූජා , මහත් ලෙස කැරෙන මල්පූජා ,බෝධි පූජා උත්සව වැනිදෑ අවශ්‍යය. කොහෙත්ම උසස් ප්‍රතිපත්තියකට හුරු පුරුදු නැති ගැඹුරු නුවණක් නැති බහුතර ජනයා එකී පූජෝත්සව ආදියට කැමැත්තෝය. ඒවා මගින් තාවකාලිකව සිත සැනසීමක් ලබති. එබඳු වැඩෙහි යළි යළි යෙදීමෙන් කලෙකදී දුසිරිතෙන් වෙන් වූ නිතර පන්සිල් රකින ආගමට ලැදි මිනිස්සු වෙති. තවද පසුව ඔබසර රකින්නටද සමත් භාවනා පැත්තටද ඇදුණු සිතැත්තෝද වෙති. මෙසේ ක්‍රමයෙන් ආධ්‍යාත්මික අභිවෘද්ධිය සලසා ගනිති. මෙය පටන් ගැනුණේ ආමිස පූජා පැත්තේ වූ පුද පෙරහරෙනි. මෙසේ ආමිස පූජාවද මිනිසෙකුගේ හැදීමට උපකාරී වෙයි.

එහෙත් අද ආමිස පූජාවේ යෙදෙන, පෙරහරවල් කරවන අයට අනුශාසනා කරන ආචාර්ය පක්ෂයේ වැඩි දෙනෙක් එක් වරදක් කරති. එනම් පහළම බාලාංශයේ ඉන්නා සිසුවන් හැමදම් රඳවා එයින් ඉහළට නොයවා, ඒ පාඩමම දිගටම ඉගැන්වීමය. එයින් චිත්තයේ තමන් තුළ විශේෂ දියුණුවක් බව දුටු හැටියේ ඒ බාලාංශයෙන් හැර දමා අන් පාසලකට ඇතුළු වන්නට සිතීමය.

පුද පෙරහැර ආදිය ලෙසින් කෙරෙන ආමිස පූජාවන් අවශ්‍යය. එමෙන්ම ප්‍රතිපත්ති පූජාවන් අවශ්‍යමය. නමුත් ඒ දෙකෙන් ප්‍රතිපත්ති පූජාව ශ්‍රේෂ්ඨය.

පූජ්‍ය ගල්දෙළ පියනන්ද හිමි
ගණේවත්ත පුරාණ විහාරය, මෝමිරිය කලුවෙල




"යකඩයෙන් නැගුණ මලකඩ ඒම යකඩයම කා දමයි. නුවණින් තොරව විසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

## දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

### ධර්ම සංගායනාවකට කාලය ඇවිත්

[illegible]



# සඳු සතන් රැසන දළදා සමිඳුන් වැන්දෙමි

[illegible]






[illegible] ගුණසේකර ලියයි



[illegible]



# සැබෑ ධනය ශීල ධනයයි

බොහෝ කෙනෙකු දියුණුව මනින ප්‍රධාන මිණුම ලෙස සලකනුයේ ධනයයි. ගෞතම බුදුරදුන්ද ධනය දියුණුව ලෙස දේශනා කළහ. එහෙත් එය හුදෙක් මිල මුදල් පමණක් ලෙස දේශනා නොකළ අතර ධනය අවශ්‍ය යැයි සඳහන් නොකළහ. එහෙත් එය ඉපයිය යුත්තේ ඉතාම යහපත් ලෙසය. එනම් සැහැසි නොවී ධර්මයට එකඟවය (ධම්මේන අසාහසේන) භෞතික ධනවත්කම සැබෑ පොහොසත් කම ලෙස නොසැලකූ අතර එය එක් ඇසක් පෙනීම හා සමාන කළහ. ආධ්‍යාත්මික සංවර්ධනය හෙවත් ධනවත්කම ඇති කර ගැනීමට අවශ්‍ය ධනය පිළිබඳ බොහෝ දේශනා ඇති අතර අ.නි. සත්තක නිපාතයට අයත් සප්තධන සූත්‍රය සැබෑ දියුණුවට අයත් ධන වර්ග 07 ක් සඳහන් කරයි. මින් ශ්‍රද්ධා ධනය , ශ්‍රැතධනය, ත්‍යාගධනය, ප්‍රඥාධනය බොහෝ කෙනෙකු තුළ අඩුවැඩි වශයෙන් දක්නට ලැබේ. බොහෝ වේලාවට සීල ධනයෙහි අඩු ප්‍රදුදුකම නිසා තමා මෙන්ම සමාජයද අයහපත් වැරදි දිසාවට ගමන් කිරීම වර්තමාන ජීවිත තුළ දකිය හැක. එහෙයින් මේ ලිපියේ දී සීලය හෙවත් කායික වාචසික හික්මීම කෙසේ විය යුතුද යන්න වැඩි අවධානයක් යොමු කෙරේ. ගිහි හෝ වේවා, පැවිදි හෝ වේවා තම ජීවිතයට අනුකූලව සීල සම්පන්න විය යුතු අතර එසේ නොවී ලබන ප්‍රභා පහසුකම් ගිනි අඟුරු අනුභවය හා සමානය. ත්‍යාග ධනය නොමැතිවීම සසර භව සමුද්‍රය ගිනවීමටත් ශ්‍රැතයත්, ශ්‍රද්ධාවත් නැති වීම නිසා සසර දික් වීමටත් බලපාන අතර සීලය එසේ නොවේ. තමන් මුලාවී අනෙකාද මුලාවට පත් කරනවා පමණක් නොව සමස්තයටම හානිකරයි. කායිකව හා මානසිකව තමා සංවරයට පත්වීම තමන් නිසා කුරා කුහුඹුවකුගේ ජීවිතයක් හෝ විනාශ නොකිරීම නොපෙනෙන දෙවියෙකුගේ කැමැත්තට හට කෙනෙකුගේ ජීවිත විනාශ නොකිරීම ආගමේ නාමයෙන් හෝ වෙනත් හේතුවක් පදනම් කරගනිමින් සිදුකරන හිංසා පිටු දැකීම සීලයයි. සැබෑ දනය සතුන් මිනිසුන් මරා සිදු කරනු ලබන යාගය නොවන බව කූට දන්ත සූත්‍රයේදී බුදු රදුන් දේශනා කළහ. කිසිවෙකු ගේ නාමයෙන් කිසිවෙකුට මිනී මැරීම කළ නොහැකිය. එසේ ලෙයට ලෙය ඉල්ලනුයේ යක්ෂ කොට්ඨාශයන් මිස දෙවියන් නොවේ.



තමාගේ ජීවිතය පවා තමාම නැතිකර ගැනීම ධර්මයට අනුව පාපයකි. කායිකව නොව වාචසිකව හෝ තවෙකුට හිංසා කිරීම යහපත් පැසසිය යුත්තක් නොවේ. තාමහෝයි ගිහි පිරිස් නිති පන්ව, සීලයෙන් යුක්තවීමක්

අවශ්‍ය විට අටසිල් දසසිල් ආරක්ෂා කිරීම තුළින් සිදුවනුයේ කායික වාචසික සංවරයයි. සීලයෙහි පිහිටා සමාධිය ප්‍රඥව වැඩිය යුතුය. (සීලේපතිට්ඨාය නරෝ සපඤ්ඤො) භික්ෂු භික්ෂුණීන්ට පනවා වදළ සීලය ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයයි එය විනය ලෙස දැක්වේ. විනයෝනාම සාසනස්ස ආයු" ලෙස සඳහනෙහි ආයුෂ සීලය බව වදාරන්නේද එහෙයිනි. සිල්වත් බව බාහිරින් පමණක් දක්වා හිත සිල්වත්ත නොමැති නම් ඔහු පැවිද්දෙකු වුවත් ගැරහිය යුතුය. තොටගමුවේ රාහුල හිමියන් පවසනුයේ එවන් දුසිල්වතුන් උදෑසන දකිම පවා අසුබ දෙයක් ලෙසයි. මහා මංගල සූත්‍රයේ දී "සමණානඤ්චදස්සනං" ලෙස භික්ෂූන් දකිම සුබයැයි සඳහන් කරන්නේ භික්ෂු ආකල්ප සහිතව සිල්වත් මෙන්ම ගුණවත් භික්ෂූන් දකිමයි. හිසමුඩුකරගත් පමණින් භික්ෂුවක් ලෙස නොසලකන්න යැයි (න මුණ්ඩකේන සමණො) දේශනාවේ දක්වනුයේ බුද්ධ චීවරයට මුවාවී අධර්මික කටයුතු වල නියලෙස ශ්‍රමණවේශධාරීන් එද මෙන්ම අදද ඇති නිසාවෙනි. බොහෝ ප්‍රදේශවල ඇතැම් ගිහියන් මෙසේ සිවුරුදරාගනිමින් භික්ෂු සංස්ථාව පරිහානියට පත්වන සේ හැසිරෙයි. ඒ බව බොහෝ මාධ්‍ය ආයතන පවා වරින් වර හෙළි කළ බව හොරහසකි.


චුල්ලහත්ථිපදෝපම සූත්‍රයේ දී මෙන්ම විශේෂයෙන් කූටදන්ත සූත්‍රයේදී ශීලයෙහි ප්‍රභේද 03 ක් දක්වා ඇත. ඉන් උපසම්පද භික්ෂුව විසින් නොකළ යුතු ක්‍රියාකාරකම් ලැයිස්තුවක්ද දක්වා ඇත. එම බෙදීම මෙසේ ය.

1 චූල සීල
2 මධ්‍යම සීල
3 මහා සීල වශයෙනි.

මෙහි චූලසීලයෙන් අවධාරණය වන්නේ සතා සිව්පාවාට පමණක් නොව ගහකොළට පවා හිරිහැර නොකිරීමයි. එසේ සිදුකිරීම පවා සීල ධනයට හානියකි. ගහක ඇති එකම වෙනස හදවතක් නොමැතිකම පමණි.


ශ්‍රද්ධාවෙන් යුතුව දෙන දනය වලදන භික්ෂුව රාජකථා, චෝරකථා , ගම ගැන කථා කිරීම ආදී අයහපත් දෙතින් කථාව සිදුකිරීම මධ්‍යම ශීලයට හානිගෙන එන්නකි. එසේම තමන් දහම් දන්නා බවත්, අනෙක එසේ නොදන්නා බවත් තමන් විනයානුකූල වන අතර අනෙකා එසේ නොවන බවත් තමන් වැරදි නොකර අංග සම්පූර්ණ කෙනෙකි, අනෙකා එසේ නොව බොහෝ වැරදි කරයි. ආදී ලෙස අනෙකාට චෝදනා කරයිද එහිදිද මධ්‍යම සීලය භේදනය වේ.

තවද රජ්ජුරුවන්ගේ, ඇමැතියන්ගේ , ක්ෂත්‍රිය ධනවතුන්ගේ , රජ කුමාරවරුන්ගේ දූත මෙහෙවරෙහි යෙදෙමින් භික්ෂුවට නොගැලපෙන හැසිරීම් ඇතිකර ගන්නේද පඬිවුඩ හුවමාරුවේ යෙදෙන්නේද එය ඔහුගේ ශීලය බිඳීමකි. කුහකකම් කරමින් ලාභ සත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ චාටු බස් කථා කරන්නේද ලාභාපේක්ෂාවෙන් අනායන් ට ගරහන්නේද ලාභයෙන් ලාභ සොයන්නේද එයද සිල් බිඳීමට හේතුවකි.



ශ්‍රද්ධාවෙන් දෙන දනය වළඳන භික්ෂුව විසින් නොකළ යුතු ක්‍රියා සිදුකිරීම මහා සිල් බිඳීමට හේතු වේ. එනම් අංග ශාස්ත්‍රය නිමිත්ත ලක්ෂණ ස්වප්න ශාස්ත්‍රයා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රය, වාස්තු විද්‍යාව ආදී නොමැති තිරශ්චීන විද්‍යාවෙන් මිත්‍යා ආජීවයෙන් ජීවිත පවත්වා ගැනීම මෙසේ සිල් බිඳීමට හේතුවේ. මෙසේ මන්ත්‍ර ගුරුකම් මිනණකමට නොගැලපෙන ක්‍රියා සමූහයකි. තවද රජවරුන්ට යුද්ධයට උදව් කිරීම, නැකැත් කීම තම රජුට ජය සහ අන්‍ය රජුට පරාජය අත්වේවා යැයි කීම අයහපත්ය. එසේ කියා ඔත්තුවට් ලැබීම කෙසේ වත් භික්ෂුවකට නොගැලපෙන්නකි. අමුසැමියන් සමගි කිරීම වෙන් කිරීම මුදල් ණයට පොලියට දීමට නැකත් කීම සෞභාග්‍ය ඇති වීමට යන්ත්‍ර කරදීම බිම පාලවීමට හදි හූනියම් කිරීම පේන කියවීම භූත දෝෂ යැයි පවසා යන්ත්‍ර මන්ත්‍ර ජීවත් කිරීම මෙවැනි තිරශ්චීන විද්‍යාවන්ගෙන් යුක්ත වීම මහාසිල් බිඳීමට හේතුවේ. තවද සෙත්පතා ගිනි පිදීම ලය විරේක කරවීම නාශය දීම, ගිහියනට වමනය කරවීම, ගිහියනට ගල්‍ය කර්ම කිරීම ආදී තිරශ්චීන විද්‍යා භික්ෂුවට අකැප වන අතර යමෙක් මෙයින් යුක්තවන්නේද ඔහු සැබෑ භික්ෂුවක් නොව භික්ෂු ප්‍රතිරූපකයෙකි. බ්‍රහ්මජාල සූත්‍රය මෙවන් පිරිස් පිළිබඳ සඳහන් කරයි.

සීලය ධනයක් මෙන්ම මහා සුවඳකි. සීලය හා සමාන සුවඳක් නැත. (සීල ගන්ධ සමෝනත්ථි) භික්ෂුවකට හෝ වේවා ගිහියෙකුට හෝ වේවා මෙය සසර මහත් ආභරණයකි. විසුද්ධි මාර්ගයෙහි සීල නිර්දේශයට අනුව සිල්වත් වීමේ ආනිසංස දැන ගැනීමත් දුසිල්වත් වීමේ විපාක දන ගැනීමත් තුළ පුද්ගලයා සීල ධනයෙන් යුක්තවේ. ස්වභාවික උවදුරුවලින් පවා සිල්වතාට හානි නොකෙරෙන බව මහාවංශයේ වනයේ ඇති වූ ගින්න මහා උදාහරණයකි. සිල්වත්වීම තුළ නැගෙන සුව සොයන සම්පත් බහුලව නොලැබුණත් නොනැසෙන සසර බොහෝ සැපසම්පත් ලද හැකි බව බෞද්ධ සත්ව වරිතය තුළින් පිළිබිඹු වේ. අවස්ථාවෙන් අවස්ථාව භික්ෂූන් උදෙසා විනය ශික්ෂාවන් පවා පැන වීමට බුදුරදුන් කටයුතු කළේ දුසිල්වත්ව සිට පුනය පහසුකම් ලැබීමේ අයහපත් විපාක නිසාවෙනි. නිවණ පමණීම මෙන්ම උතුම් මිනිසත් බව පිරිහී සතර අපායක වීමට තරම් මෙය හේතුවන බැවිනි. ලෞකික ජීවිතයේදී හරි හම්බ කරගන්නා ධනය ගින්නෙන්, ජලයෙන් හා සොරසතුරන්ගෙන් විනාශ විය හැකි මුත් සීලය ඇතුළු සංඛ ධනය එසේ විනාශ නොවේ.



පූජ්‍ය සියඹලාගොඩ
ධම්මානන්ද හිමි

# මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ පුරාවිද්‍යා වටිනාකමින් ඇති, ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුදබිමකි. එය කුමක්දැයි නම් කොට පිළිතුරු තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න.

ඔබේ පිළිතුරු එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

**(මීටපෙරදී පිළිතුරු එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට ද්විතීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා චිත්‍රයක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන චාර්ලට් බෙහරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම සෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)**



# ධම්මදීප සභාවේ ප්‍රථම සමාජ සද්කාරය ගර්භණී මාතා හරසර නමින්



ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයේදී 2013 දෙසැම්බර් මස 08 වැනි ඉරු දින පෙරවරුවේ පවත්වන්නට යෙදුන ගර්භණී මාතා හරසර වැඩසටහන කාගේත් ප්‍රසාදයට ලක්වූ උත්තම පුන්‍යක් විය.

ශ්‍රී දළදා මාලිගාවේ කේවාර භාරව කටයුතු කරන මල්වතු පාර්ශවයේ කාරක සංඝසභික පූජ්‍ය හිඟුරුවාවේ මේධාංකර නායක හිමිපාණන්වහන්සේගේ සංකල්පයක් ලෙසින් උන්වහන්සේගේ පූර්ණ අනුග්‍රාහකත්වය යටතේ සිංහල ජාතියේත්, සම්බුද්ධ ශාසනයේත් චිර පැවැත්ම හා අභිවර්ධනය උදෙසා මෙන්ම බෞද්ධ සමාජයේ යහපැවැත්ම හා අභිවර්ධනය උදෙසාත් පිහිටුවා ගන්නා ලද ධම්මදීප සභාවේ සමාජ සත්කාරක හා සුභ සාධන වැඩ සටහන් යටතේ සිදුකරන්නට යෙදුණ ප්‍රථම සමාජ සත්කාරය ලෙස මෙම වැඩ සටහන සංවිධානය කොට ක්‍රියාත්මක කෙරිණ.

මෙම වැඩ සටහන සංවිධානය කිරීමේ මූලික අරමුණ වී තිබුණේ සිංහල බෞද්ධ තරුණ දෙමාපියන් වෙත විශේෂිතවූත්, කාලීන වූත් පණිවුඩයක් ලබාදීමය. වර්තමානයේ සිංහල පවුල්වල දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකුට හෝ එක් අයෙකුට සීමා වී ඇත. "ප්‍රංචි පවුල රත්තරන්" යනුවෙන් හැත්තෑව දශකයේ සමාජගත කරන ලද සංකල්පයට අනුගතව කටයුතු කිරීම මෙන්ම ආර්ථික අපහසුතා, දරුවන් රැකබලා ගැනීමේ අසීරුතා යනාදී කරුණුද මෙම තත්ත්වයට හේතුව වී තිබෙන බව ධම්මදීප සභාවේ අදහස වී තිබේ.

මෙම තත්ත්වයට පිළියමක් ලෙස සංවිධානය කෙරුණු ගර්භණී මාතා හරසර සද්කාර්යය සඳහා ගර්භණී මව්වරුන් තෝරා ගෙන තිබුණේ මහනුවර දිස්ත්‍රික්කයේ දහට පිහිටුවාගෙන ඇති ප්‍රාදේශීය ධම්මදීප සභාවලින් නම් කරන ලද අයගෙනි. ඒ අනුව ගර්භණී මාතාවන් 60 දෙනෙකු මේ සඳහා තෝරාගෙන තිබූ අතර ඒ සඳහා ප්‍රාදේශීය ධම්මදීප සභාවල ලේකම්ධුරය දරන ස්වාමීන්වහන්සේලා මෙන්ම ශාසනාරක්ෂක බල මණ්ඩලවල ලේකම් හිමිවරුන්ගේද සහාය ලබා ගැනිණ. මෙම තෝරා ගැනීම්වලදී ග්‍රාමීය පිළිදු පවුල්වල ගර්භණී මාතාවන් කෙරේ වැඩි අවධානයක් යොමු වීමද විශේෂිත වූ කරුණකි.

වැඩ සටහන මෙහෙයවමින් අස්ගිරි පාර්ශවයේ කාරක සංඝසභික පූජ්‍ය කුඩුක්කඳන්වල ප්‍රඥාසාර හිමියන් ප්‍රමුඛ දරුවන් වැඩි දෙනෙකු සිටීමේ වැදගත්කම පවුලකට මෙන්ම මෙම ජාතියට, ශාසනයට වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳව ඉතා හරවත් දේශනයක් පැවැත්වූහ.

වෛද්‍ය උපදෙස් ලබාදීම වෛද්‍ය ශාන්ති රාජපක්ෂ මහත්මිය සහ වෛද්‍ය තනුජා හේරත් මහත්මිය විසින් සිදුකරනු ලැබිය.


ගර්භණී අවධියේ මවක් විසින් දරිය යුතු දහම් සිහිවලි පිළිබඳව අනුශාසනාව පවත්වන ලද්දේ සොළොස්මස්ථානාධිපති අස්ගිරි පාර්ශවයේ කාරක සංඝසභික පූජ්‍ය වේඩරුවේ උපාලි නායක හිමිපාණන්වහන්සේ විසිනි.

අනතුරුව පූජ්‍ය හිඟුරුවාවේ මේධාංකර හිමිපාණන් සහ පූජ්‍ය කුඩුක්කඳන්වල ප්‍රඥාසාර හිමිපාණන් විසින් ගර්භණී මාතාවන් හට ළදරු උපකරණ කට්ටල බෙදා දුන් අතර අවසානයේ මහා සංඝරත්නය විසින් සෙත් පිරිත් සජ්ඣායනාවක්ද පවත්වන ලදී.

ගර්භණී මාතාවන් හට මෙන්ම ඔවුන්ගේ භාරකරුවන් වශයෙන් පැමිණ සිටි අයද ඇතුළුව 150 දෙනා හට දිවා ආහාරය සඳහා ආරාධනා කරන ලද්දේ ගරු දියවඩන නිලමේතුමන් විසිනි. දිවා ආහාරයෙන් පසුව ගර්භණී මාතාවන් විසින් මහා සංඝරත්නයට වැඳ නමස්කාර කිරීමෙන් අනතුරුව වැඩ සටහනේ කටයුතු නිමාවට පත්විය.

ආරාධනය පරිදි අස්ගිරි පාර්ශවයේ ලේඛකාධිකාරී පූජ්‍ය ආණමඩුවේ ධම්මදස්සී හිමිපාණන් සහ මහනුවර දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේකම් පූජ්‍ය හගුරන්කෙත සද්ධානන්ද හිමිපාණන්ද වැඩම කර තිබිණ.

ගැමුණු ඒකනායක



සේරිවාණිජ ජාතකයෙන් හෙළිවන

# ලෝභයෙන් හා කපටිකමින් මිදීමේ අනුහස්

සකල ගුණ නිධාන වූ, අසරණ සරණ වූ අප සම්මා සම්බුද්ධරජාණන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සමයෙහි එක්තරා පසුබට වූ, අලස වූ, වීර්ය නැති භික්ෂූන්වහන්සේ නමක් අරභයා මෙම සේරිවාණිජ ජාතකය දේශනා කොට වදාළසේක. ඒ වීර්යය නැති භික්ෂූන්වහන්සේ, අවශේෂ භික්ෂූන්වහන්සේ විසින් බුදුරජාණන්වහන්සේ සමීපයට කැඳවාගෙන ගොස් දැක්වූ කල්හි බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේ අමතා, "ඔබ මෙබඳු මාර්ගඵලදායක ශාසනයෙහි මහණ වී වීර්යය අත්හරින්නෙහි ද? එය ලක්ෂයක් වටිනා රන් තලියක් බව දැන දැනම වංචනික ලෙස පැහැර හැරීමෙන් පිරිහුණා වූ සේරිවාණිජ වෙළෙන්දා මෙන් බොහෝ කාලයක් ශෝක කරන්නට හේතු වන කාරණයකි"යි වදාරා, තුෂ්ණිම්භූතව වැඩහුන්සේක.

එම අවස්ථාවෙහි එතැනට රැස්වූ භික්ෂූන්වහන්සේ මනාව සිවුරු සකස් කොට ගෙන, කෙසෙල්කැණක ඔරින් නැමුණා වූ කෙසෙල් ගසක් මෙන් බුදුරජාණන්වහන්සේ ඉදිරියෙහි නැමී, දොහොත් මුදුනෙහි තබා ගොරව නමස්කාර පූර්වකව ඉතා කරන ලද ප්‍රකාශයෙහි අර්ථය කුමක්දැයි දේශනා කොට වදාරන ලෙස බුදුරජාණන්වහන්සේට ආරාධනා කළාහුය. එවිට බුදුරජාණන්වහන්සේ පෙර භවයෙන් වැසී තිබුණා වූ එම කථාව විස්තර කොට වදාළසේක.

යටගිය දවස, මහාබෝධිසත්වයෝ සේරිව රාජ්‍යයේ රන් පසුම්බියක් කරේ පැළඳ, කිහිල්ලෙහි රැඳවාගෙන වෙළඳාම් කළ හෙයින් කච්ඡපුට නම් වෙළෙන්දෙක්ව ඉපිද ප්‍රකටව සිටියේය. ඒ වෙළෙන්දා සේරිවාණිජ නම් එක් ලෝභී වෙළෙන්දෙකු සමග නීලවාහිනී නම් ගඟෙන් එතෙරව, අන්ධපුර නම් නුවරට ගොස්, එනුවර වීදි බෙදාගෙන තමන්ට ලැබුණු වීදියෙහි බඩු විකුණමින්

ඇවිද්දේය. ඒ සේරිවාණිජ ලෝභී වෙළෙන්දා තමා පැමිණි වීදියෙහි බඩු විකුණමින් ඇවිදින අතර, ඒ වීදියෙහි එක් දුප්පත් සිටු ගෙයක කුඩා මිණිබිරියක් හා මිත්තණියක් පමණක් තම සියලු ඥාතීන් හා වස්තුව නැසී ගොස් අසරණව, අනුන්ට බැලමෙහෙකම් කොට ජීවත්වූහ. මේ දෙදෙනාගේ ගෙයි කලක් ජීවත්ව සිට මියපරලොව ගිය මහසිටාණන් අනුභව කළ රන් තලියක් වළං අතර කිසි දිගු කාලයක් නිස්සේ ප්‍රයෝජනයට නොගත් බැවින් මලබැඳී තිබිණ. ඔවුහු දෙදෙනා එය රන් තලියක් බව නොදැන සිටියහ.

මේ අතර පෙර කී ලෝභී වෙළෙන්දා කළා වළලු ගනිව්'යි කියමින් ඇවිදින අතර, ඒ ගෙදර අසලට පැමිණියේය. ඒ ගෙදර කුඩා මිණිබිරිය වෙළෙන්දා දැක මිත්තණියට කතා කොට, මෑණියනි මට එක් පළඳනාවක් අරගෙන දෙන්නැ'යි කීවාය. මිත්තණිය එය අසා, අපි දුප්පත් වෙමු. තුමක් දී පළඳනා ගන්නෙමුදැ'යි විමසුවාය. එවේලෙහි ඒ මිණිබිරිය අපගේ ගේ තලියක් ඇත. ඒ තලියෙන් අපට කිසි ප්‍රයෝජනයක් ද නැත. ඒ තලිය දී වළලු ගනිමු'යි කීවාය. මිත්තණිය ඒ මිණිබිරියගේ ඇවිටිලි කිරීම බලවත් වූ නිසා වෙළෙන්දා කැඳවා අසුනක හිඳුවා, තලිය දී, මේ තලිය අරගෙන දියණියට කිසියම් පළඳනාවක් දෙන්නැ'යි ඉල්ලා සිටියාය. ඒ ලෝභී වෙළෙන්දාත් තලිය අතින් රැගෙන එහි ඉදිකටුවෙන් ඉරක් ඇඳ, එය රන් තලියක් බව දැන, මොවුන්ට කිසිවක් නොදීම තලිය ගනිමි'යි සිතා, මෙම තලිය කියක්වත් වටින්නේ නැත, එබැවින් මිලක් කිව නොහැකියි පවසා, තලිය බිමට දමා අසුනෙන් නැගී සිට යන්නට ගියේය.

මේ අතර බෝධිසත්ව වෙළෙන්දා එම වීදියෙහිම වළලු ගන්නැ'යි කියමින් මිත්තණිය හා දියණිය වසන ගේ දොරකඩට පැමිණියේය. ඒ හඬ ඇසූ මිණිබිරිය පළමු පරිද්දෙන්ම මෑණියනි, මට වළලු අරගෙන දුන මැනව'යි කියමින් ඇවිටිලි කළාය. එවිට මිත්තණිය, දියණියනි, පළමු ආ වෙළෙන්දා තලිය කිසිම මිලක් නොවටිනා බව කියමින් බිම දමා යන්නට ගියේය. දැන් තුමක් දී ගනිමුදැ'යි ඇසුවාය. එය ඇසූ දියණිය, මෑණියනි, ඒ වෙළෙන්දා තද පරුෂ ගති ඇත්තෙකි. මේ වෙළෙන්දා ප්‍රිය මනාප දැකුම් ඇති කෙනෙකි. මොළොක් කථා ඇත්තෙකි. එහෙයින් මේ තලිය ඔහුට දී වළලු අරගෙන දුන මැනව'යි කීවාය. ඇගේ බස් අසා මිත්තණිය එසේනම් ආපසු කැඳවන්නැයි කීවාය.

බෝධිසත්ව වෙළෙන්දා පැමිණි පසු, ඒ තලිය දුන්නාය. බෝධිසත්වයෝ ඒ තලිය රන් තලියක් බව දැන, මෑණියනි, මේ තලියට දිය හැකි තරම් අගනා බඩු මා සතුව නැතැයි කීවේය. එය අසා මිත්තණිය, මීට පෙර

> "සේරිවාණිජ ජාතක කථාවෙන් හෙළිවන වීර්යය නොකොට, කුසීතකමින්, අයුතු වෙළඳාමෙන්, ලෝභසිතින්, කපටිකමින් කටයුතු කිරීමේ විපාක මැනවින් හඳුනාගෙන මහත් වීර්යයෙන්, අවංකකමින්, මසුරුකම අත්හැර, දැහැමිව ජීවත් වී සසර කතරින් එතෙරවීමට අපිදු අදිටන් කරගනිමු."

ආ වෙළෙන්දා මේ තලිය අඩමස්සකටවත් නොවටිනා බව කියා බිමට විසිකර දමා ගියේය. මේ තලිය වූ කලී ඔබේ පිනෙන් රත්‍රං බවට පත්වූවා විය හැකියි. ඔබට මේ තලිය දෙන්නෙමැයි කියා, අපිට යන්තම් දෙයක් දී මේ තලිය ගෙනයන්නැයි කීවාය. එකෙණෙහි බෝධිසත්වයෝ අත තිබූ කහවණු පන්සියක් හා කහවණු පන්සියයක් වටිනා බඩු ද දී මට මේ පසුම්බිය හා කහවණු අටක් පමණක් දෙන්නැයි කීවේය. කහවණු අටක් හා පසුම්බිය පමණක් රැගෙන ඔහු යන්නට ගියේය. අනතුරුව මහබෝසතාණෝ වහ වහා ගං තෙරට ගොස් ඔරු පදිනා තොටියාට කහවණු අටක් දී ඔරුවට නැංගේය.


ඒ ලෝභී වෙළෙන්දා නැවතත් පෙර ගෙදරට ගොස්, පළමුව මා බලාසිටි ඒ තලිය ගෙනෙන්නැයි කීවේය. යන්තම් මිලක් ඔබට දෙන්නෙමි'යි කියා එය ඉල්ලීය. එය ඇසූ මිත්තණිය හා දියණිය ඔහුට බැණ වැදී, ලක්ෂයක් වටිනා රන් තලිය අඩමස්සකත් පමණවත් නොවටියයි ඔබ කීවෙහිය. එක් ධාර්මික වෙළෙන්දෙක් අපට දහසක් මිල දී ඒ රන් තලිය රැගෙන ගියේය. එය ඇසූ ලෝභී වෙළෙන්දා ලක්ෂයක් වටිනා රන් තලිය නොලැබීමෙන් සිදුවී ගොස් මට වූයේ බලවත් හානියකැයි සිතා, බලවත් ශෝකයෙන් සිහිවිසඥ වී තමා අත තිබූ කහවණුත්, බඩුත් ඒ ගෙදරම හැරදමා බෝධිසත්වයන් පසු පස්සෙහි දුවමින් ගංතෙරට පැමිණියේය.


ඔරුවෙහි නැගී යන බෝධිසත්වයන් දැක, එම්බල තොටිය, ඔරුව නවතා එවන්නැයි අඬගැසීය. එය අසා බෝධිසත්වයෝ තොටියාට කියන්නේ, ඔරුව ආපසු කරකවා නොපදවන්නැයි කීවේය. ඔරුව නතර නොකොට ඉදිරියටම යනු දුටු බෝධිසත්වයන් දෙස බල බලා සිටි ලෝභී වෙළෙන්දාට බලවත් ශෝකයක් උපන්නේය. ඇඟේ කෝපයකට පත්ව ලය පැළිණි. ඒ ලෝභී වෙළෙන්දා බෝධිසත්වයන් කෙරෙහි වෛර බැඳ එතැනම ජීවිතක්ෂයට පත්විය. මෙය දේවදත්ත ස්ථවිරයන්වහන්සේ බෝධිසත්වයන්වහන්සේ කෙරෙහි පළමුවෙන්ම බැඳි වෛරයයි. අනතුරුව බෝධිසත්ව වෙළෙන්දා දානාදී පින්කම් කොට මියපරලොව ගියේය.

තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා, 'මහණ පෙර සේරිවාණිජ වෙළෙන්දා ලක්ෂයක් වටිනා රන් තලිය නොලැබ, ඒ තලිය ගන්නට වීර්යය නොකොට, පිරිහී ශෝක කළේ ද? පරලෝකයට පැමිණියේ ද? එපරිද්දෙන්ම මහණ, ඔබත් මේ ශාසනයෙහි රන් තලියක් වැනි වූ ආර්ය මාර්ගයට පිවිසීමට වීර්යය නොකරන බැවින්, මාර්ග ඵලයෙනුත් පිරිහී බොහෝ කලක් ශෝක කරන්නේය. ඉදින් ඔබ වීර්යය කරන්නේ නම් නුවණ ඇති වෙළෙන්දාණන් රන් තලිය ගෙන ප්‍රයෝජන විඳි කලක් මෙන්, ඔබ ද මාගේ ශාසනයෙහි නවලෝකෝත්තර ධර්මය දැන අවබෝධ කරගැනීමට වීර්යය කළ යුතුය'යි, පූර්වාපර සන්ධි ගළපා සේරිවාණිජ ජාතකය දේශනා කොට වදාරා, සර්වඥයන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේට අරහත් ඵලය කුළුගන්වමින් ධර්ම දේශනා කොට චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. එම චතුරාර්යසත්‍ය ධර්ම දේශනාව අසා එහි කෙළවර ඒ පසුබට වීර්යය ඇති භික්ෂූන්වහන්සේ අර්හත්භාවයට පත් වූ සේක. එසමයෙහි අඥාන වෙළෙන්දා නම් දෙව්දත් තෙරණුවෝය. නුවණැති වෙළෙන්දා නම් බුදු වූ තමන්වහන්සේම වෙමියි දේශනාව අවසානයේ වදාළසේක.

සේරිවාණිජ ජාතක කථාවෙන් හෙළිවන වීර්යය නොකොට, කුසීතකමින්, අයුතු වෙළඳාමෙන්, ලෝභසිතින්, කපටිකමින් කටයුතු කිරීමේ විපාක මැනවින් හඳුනාගෙන මහත් වීර්යයෙන්, අවංකකමින්, මසුරුකම අත්හැර, දැහැමිව ජීවත් වී සසර කතරින් එතෙරවීමට අපිදු අදිටන් කරගනිමු.

කේ. මීගහකුඹුර





# දඹදිව යන්නයි

## සිත පහදා ගන්නයි

"සු ඛෝ බුද්ධානං උප්පාදෝ" - බුදුවරුන්ගේ පහළ වීම සැබැවින්ම විස්මයජනක සැපයකි. සියල්ල දෙස යථාර්ථවාදීව බලමින් මානව වර්ගයාට සසර සාගරින් එතෙර වීම පිණිස මග පාද දෙන්නට මෙලොව පහළ වූ ශාස්තෘවරයාණන් වහන්සේ නමක් වෙත් නම්, ඒ අප මහා තථාගත සම්මා සම්බුද්ධරජාණන් වහන්සේමය.

සිය උපතේදීම සත් පියුම් මත ඇවිද යමින් , සිංහනාද පවත්වා ප්‍රාතිහාර්ය පෑ මොහොතේ පටන් අසූ වසරක් දිවි ගෙවා තම අවසන් හුස්ම පොද වා තලයේ මුසු කරාවටම මෙම උත්තමයාණන් වහන්සේ කළ කී දෑ සියල්ලක්ම සැබැවින්ම අරුත්සරය. එමෙන්ම ප්‍රඥා සම්පන්නය.

පිරිනිවන් පාන්නට මොහොතකට මත්තෙන් එද අප මහා තථාගතයාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතා වදාළ පරිදි, "බුදුරජාණන් වහන්සේගේ උපත සිදුවූ ස්ථානයත්, බුදු බව ලබාගත් ස්ථානයත්, පළමුවන ධර්ම දේශනාව පැවැත්වූ ස්ථානයත්, පිරිනිවන් පෑ වදාළ ස්ථානයත්" යන මේ සිව් මහා ස්ථානයන් සැදැහැති බෞද්ධයෙකු විසින් දැකබලා , වැඳ පුද ගෙන, සිත පහද ගත යුතු පරම පූජනීය සිද්ධස්ථානයන් නම් කෙරිණි.

### නේපාලයේ ලුම්බිණිය

භාරතයේ කෝසල රාජධානියට අයත් ශාක්‍ය ජනපදයේ බොහෝම සරු සාරවත් පුරවරයක් තිබිණි. ඒ කිඹුල්වත් පුවරයි. කිඹුල්වත් පුවර එසල රජකම් කළේ සුද්දෝදන ගෙවත් සුදෝවුන් රජතුමායි. එතුමන්ගේ දේවිය වූයේ කෝලිය වංශික මහාමායා දේවියයි.


සිය කුළුදුල් දරු ප්‍රසූතිය සඳහා දේවියගේ නිවෙස බලා යාම එසල භාරතයේ චාරිත්‍රයක්ව පැවතිණි. ඒ අනුව මහාමායා දේවියත් කිඹුල්වත් පුරයේ සිට දෙව්දහ නුවර පිරිත තම දෙමාපියන්ගේ මාළිගාව බලා පිටත් වූහ. එද වෙසක් පුරපසළොස්වක පොහෝ දිනයකි. ගමනේ විඩාව නිසාවෙන් මහාමායා දේවිය මේ සුන්දර ලුම්බිණි සල් උයනට වී මදක් ගිමන් හරින්නට වූවාය. ගිමන් හරින අතරතුරේදී දරු ප්‍රසූතිය සඳහා ප්‍රණාවෙන්න කාල හෝරාව උදාවිණි.

තිලෝවටම සෙතක් ශාන්තියක් උද කරළමින් පුත් රුවනක් මෙලොව එළිය දුටුවේය. කුමරුගේ උපන් ප්‍රීතුට "සිදුහත් ගෙවත් සිද්ධාර්ථ" යන නම් තැබිණි. මහා ප්‍රඥාවතින් ලෝකය දෙස බලා සුවහසක් අසරණයින්ට පිළිසරණක් වූ අප මහා තථාගතයන් වහන්සේගේ උපත සිදුවූ ස්ථානයයි, මෙය වන අතර, එය සිදුව ඇත්තේ ක්‍රි.පූ. 623 දීය.

පුරාණයේ දී දඹදිව සිද්ධස්ථානයක් එකම දේශයකට අයත් වූවත් , පසුකාලීනව ඇති වූ දේශපාලනමය හා දේශසීමා සාධකයන් හේතුවෙන්, වර්තමානය වන විට ලුම්බිණිය නේපාලයටත් සෙසු දඹදිව සිද්ධස්ථානයන් ඉන්දියාවටත් උරුමව පවතී. ඉන්දියාවේ සිට ගොඩබිම් මාර්ගයෙන් නේපාලයේ ලුම්බිණිය බලා ගමන් ගන්නේ නම්, සුනෝලි දේශ සීමා හරහා යා යුතුව ඇති අතර, සුනෝලි දේශ සීමාවේ සිට සැතපුම් 12 ක දුරකින් මෙම අභිමානවත් ලුම්බිණිය පිහිටා තිබේ.

සිදුහත් කුමරුන්ගේ උපත සිදුවූයේ මෙම ස්ථානයේදීම වන බවට සැහැදිලිවම හඳුනා ගන්නට හැකියාව ලැබී ඇත්තේ මෙම ස්ථානයේ තිබී පසු කලෙක සොයා ගත් අශෝක කුළුන නිසාවෙනි. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 218 ක් ඉක්මව ගිය පසු ධර්මාශෝක රජතුමා, ලුම්බිණියට ගොස් වන්දනා මාන කර ගැනීමෙන් අනතුරුව මෙම කුළුන ස්ථාපිත කළ බවට ඉතිහාස විසින් සාක්ෂි දරයි. එමෙන්ම අශෝක ස්ථම්භයට අනෙක් පසින් විශාල පොකුණක් දක්නට ලැබෙන අතර, සිදුහත් කුමරාණ උපත ලද පසු එම පොකුණෙන් දෝවනය කළ බැව් කියැවේ.

පතපොතේ සඳහන් වන පරිද්දෙන් ලුම්බිණි සල් උයනේ එද තිබූ අලංකාරවත් සල් ගස් අද නැතත්, ඒ තුරුලතා ඒ ඒ පුෂ්පයන් මෙන්ම සියොතුන් ගේ ගීත රාවයන් අද දක්නට නැතත්, නේපාල රජය විසින් මෙම පින්බිම මැනැවින් සංරක්ෂණය කර තිබේ.



## බුද්ධගයාව

ලෝකවාසී බෞද්ධ බැතිමතුන් සිය පරම පූජනීයතම ස්ථානය වශයෙන් සලකනු ලබන්නේ අප මහා තථාගතයාණන් වහන්සේ සාරාසංඛ කල්ප ලක්ෂයක් මුළුල්ලේ පෙරුම්දම් පුරමින් සියලු කෙලෙසුන් නසා සම්මා සම්බුද්ධත්වයට පත්වූ ඉන්දියාවේ අඹිද්ව මේ බුද්ධගයාවයි. සසරේ අනන්ත අප්‍රමාණ දුක් සමුදයක් විඳිමින් සිය ගමනේ කෙළවර විජයග්‍රහණය කළ උතුම් පින්බිම මෙයම වේ.

බිහාර් ප්‍රාන්තයේ පිහිටි බුද්ධගයා විහාරය , විශිෂ්ටත්වයෙන් පිරිපුන් අපූර්වතම නිර්මාණයකි. බැලූ බැල්මටම මෙය හින්දු කෝවිලක අනුරුවක් මෙන් දිස් වුවද මෙම ගර්භය වටා ඇත්තේ බුද්ධ රූප සහ බෞද්ධ දර්ශනය පදනම් කරගත් ආකෘතීන්ය. අඩි 170 ක් උස් වූ මෙම ගර්භය කහ සහ දුඹුරු පැහැයෙන් දිස්වේ. විහාරයේ පහළ අභ්‍යන්තරයේ මේ ස්පර්ශ මුද්‍රාවෙන් යුක්ත රන්වන් පැහැයෙන් දිස්වෙන ශාන්ත බුදු පිළිමයකි. විහාරය පසුපසට වන්නට සිද්ධාර්ථ තවුසාණන් බුද්ධත්වයට පත් වජ්‍රාසනයක්, බුද්ධත්වය පිණිස සෙවන සලසා දුන් උතුම් වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේත් අපට දක ගත හැකිවේ. අතු පතර දස ද නොදින් වැඩී ඇති මෙම බෝධීන් වහන්සේ ගේ නිල්වන් බෝ පත්‍රයන්ගෙන් මුළු පරිසරයම සිසිල් බවකින් නහවා තිබේ.


බුද්ධගයාවේදී සම්මා සම්බුද්ධත්වය පත් අප තිලෝගුරු අමාමෑණි බුදුරජාණන් වහන්සේ , කළගුණ සැලකීමේ උතුම් ආදර්ශය ලොවට කියා පාමින් බුද්ධගයාව අවට පරිසරයෙහිම සති හයක් ගත කළ සේක.

ඒ අනුව පළමු සතියේදී තමන් වහන්සේ අවබෝධ කර ගන්නා වූ සත්‍ය ධර්මය යළි යළිත් මෙනෙහි කළ අපර තිසු වජ්‍රාසනයත්, බුදු බව ලබන්නට උපකාර කළ බෝධීන් වහන්සේට කෘතඥවිදිත්වය පළ කරමින් දෙවන සතියේදී අනිමිස ලෝචන පූජාව පැවැත්වූ ස්ථානයත්, තුන්වන සතියේදී රුවන් සක්මනෙහි නිරත වූ ස්ථානයත්, සිව්වෙනි සතිය ගත කළ රුවන් ගෙයත්, පස්වෙනි සතිය ගත කළ අජපල් නුග රුක පිහිටි ස්ථානයත්, මිදෙල්ල තුරු සෙවණේ සමවත් සුවයෙන් හයවෙනි සතිය ගත කරන අතරතුර මුචලින්ද නාගයා දරණ ලාගෙන සිටි ස්ථානයත්, සත්වන සතියේදී අරහත් ඵල සමාපත්තියෙන් වැඩ සිටි රාජායතන කිරිපලු නුග රුකත් බුද්ධගයා පරිශ්‍රයේදීම අපට දක ගත හැකිවේ.

මීට අමතරව ගංගා නම් ගඟත්, සුජාතා සිටු දේවිය සිදුහත් තවුසාණන්ට කිරිපිඩු පූජා කළ ස්ථානයත්, බුදුරජාණන් වහන්සේට සොත්ථිය බ්‍රාහ්මණයා කුස තණ අට මිටක් පූජා කළ ස්ථානයත් බුද්ධගයාව ආසන්නයේම පිහිටා තිබේ.

## බරණැස ඉසිපතනාරාම මිගදාය

සියලු ලෝ වැසියනට සසර කතරෙන් මිදෙන්නට මග සාදා දුන් අසිරිමත් බුදු දහම ලොව පුරා පැතිර යන්නට මං පෙත් විවර වූයේ මෙම පුද භූමියෙනි. සම්මා සම්බුද්ධත්වයට පත් අප තථාගතයාණන් වහන්සේ මහත් වෙහෙසක් දරා තමන් වහන්සේ විසින් අවබෝධ කර ගන්නා වූ ඒ උතුම් ශ්‍රී ධර්මස්කන්ධය, ප්‍රථමයෙන්ම දේශනා කළ යුත්තේ කා හට දැයි බුදු නුවණින් විමසා බැලූ කල පස්වග මහණුන් අරභයා එය දේශනා කරන්නට සුදුසු යැයි තීරණය කෙරිණි. ඒ සඳහා සැතපුම් 290ක් දුර ගෙවා බුදුරජාණන් වහන්සේ බරණැසට වැඩි සේක.





ඒ අනුව ඇසළ පුන් පොහෝ දිනෙක බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාම මිගදායේදී පස්වග මහණුන් උදෙසා ''ධම්මචක්කප්පවත්තන සූත්‍රය'' හෙවත් ''ධම්සක් පැවතුම් සූත්‍රය'' දේශනා කළ අතර, ප්‍රථම දහම් දෙසුම් ශ්‍රවණය කරන්නට දෙවි බඹුන්ද එක්ව සිටියහ.

ධර්ම දේශනාව අවසන් වත්ම කොණ්ඩඤ්ඤ තවුසාණෝ සෝවාන් ඵලයටත්, දෙවිවරුන් මහත් සතුටටත් පත්වූහ. එමෙන්ම බුදුරජාණන් වහන්සේ සිය පළමු වස් කාලය වශයෙන් තෙමසක් ගත කිරීමත්, යසකුල පුත්‍රයා සහ සිය මිතුරන් පනස් හතර දෙනා ධර්මය ශ්‍රවණය කිරීමත් මෙන්ම තවත් ශාසනික වර්ධනයක් ඇති බොහෝ දේ සමගින් බෝසත් චරිතවලදී සහ සම්බුදු චරිතයේදී වැදගත් සිද්ධීන් රැසකට බරණැස ඉතා චරිතා සන්ධිස්ථානයක් වූයේය.

නව මූලගන්ධ කුටි විහාරය, ධම්මික ස්ථූපයත්, ධර්මරාජික ස්ථූපයත්, පැරණි මූලගන්ධකුටි විහාරයත්, අශෝක ස්ථම්භයත්, සම්මුඛ චෛත්‍යයත් ඇතුළුව ඉසිපතන භූමි පරිශ්‍රයේ ආරාම, භාවනා කුටි, ස්ථූප, විහාර මන්දිර, සක්මන් මළු සහ තවත් පෞරාණික නටබුන් රැසක් අද දක බලා වන්දනා කරගත හැකිවේ.

වර්ෂ 1931දී ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් විසින් ඉදිකරන ලද නව මූලගන්ධකුටි විහාරයේ පසුපස ඇති බෝධි වංශය ධර්මපාලතුමා විසින් රෝපණය කරන ලද්දක් වන අතර, එය ඉදිරිපස බුදුරජාණන් වහන්සේ පස්වග මහණුන්ට ධර්මය දේශනා කරන අයුරු දක්වෙන ප්‍රතිමාවක්ද ස්ථාපිත කර තිබේ.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ වැඩ සිටි යුගයේ පටන් මෙම සුන්දර උද්‍යාන පියසේ බොහෝ සෘෂිවරුන් මෙන්ම තවුසන්ද වාසය කළ නිසා 'ඉසිපතනය' නමින් හඳුන්වනු ලැබූ අතර, මුවන් සඳහා අභය භූමියක් වූයෙන් 'මිගදාය' වශයෙන්ද හැඳින්වේ. වර්තමානයේදී මෙම ස්ථානය හඳුන්වනු ලබන්නේ 'වාරාණසී' යනුවෙනි.

## කුසිනාරාව

කුසිනාරාව හෙවත් කුසිනගර් යනු, තිලෝගුරු අමාමෑණි බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවූ ස්ථානයයි. අසූ වසරක් දිවි ගෙවූ අප මහා තථාගතයාණෝ ආදර්ශයන්ගෙන් පිරුණු දහමක් ලොව පුරා පතුරුවා පිරිනිවන් පෑ වදාළේ මල්ලව රජදරුවන්ගේ උපවත්තන නම් වූ මෙම සල් උයනේදීය.


සිය පරිනිර්වාණය සඳහා ලොව්තුරු බුදුරජාණන් වහන්සේ විසින්ම තෝරාගත් ස්ථානය කුසිනාරාවයි. අඹිද්ව සියලුම සිද්ධස්ථානයන් වන්දනා කරගෙන මෙම ස්ථානයට පැමිණෙන ඕනෑම සැදැහැතියකුගේ දෙනෙතට කඳුළු උනන්නේ නිරායාසයෙනි. ඒ මන්ද යත්, මුළු ලොවම එළිය කළා වූ අප මහා උත්තමයාණන් වහන්සේගේ සමුගැන්ම මෙම ස්ථානයේදී සනිටුහන් වී තිබීමය.

බොහෝ වෙහෙසකට පත්ව කුසිනාරාව බලා පැමිණි බුදුරජාණන් වහන්සේ, කුකුත්ථා ගංගෙර අභියස සිට අද දිනයේ තමන් වහන්සේ පිරිනිවන් පාන බව ආනන්ද හාමුදුරුවන්ට වදාළහ. ලොවම කම්පා කරවූ මෙම වදන් පෙළ වදළ බුදුරජාණන් වහන්සේ, කෙතරම් අපහසුවෙන් වුවත් තමන් වහන්සේ විසින්ම ගඟට බැස සිය ශරීරය දෝවනය කර ගත්හ.

බුද්ධික සංජීව

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙති. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

# කෙනෙකු දමනය කළ හැකි හොඳම ක්‍රමය



බුදුන් දවස ගමනාගමනය සඳහා වූ ඇත්, අස්, රථ යනාදියෙන් වේගවත්ම වාහනය ලෙස ප්‍රයෝජනයට ගනු ලැබුවේ අශ්වයාය. මේ නිසා එකල අසුන් හික්මවන්නා කාගෙත් සැලකිල්ලට ගතු වූ කෙනෙකු විය. දිනක් බුදුරජාණන් වහන්සේ හමුවීමට ප්‍රසිද්ධ අසුන් හික්මවන්නෙකු පැමිණියේය. ඔහු නමින් කේසිය.

බුදුරජාණන් වහන්සේට "පුරිසදම්මසාරථී" යැයි නමකි. එලෙසම කේසිට "අස්සදම්මසාරථී" යැයි කියති.

මේ අසිරිමත් හමුවීම සිදුවූයේ සැවැත්නුවර ජේතවනාරාමයේදීය. බුදුරදුන් වෙත පැමිණ වැඳ කේසි අසලින් හිඳ ගත්තේය.

"කේසිය, මම තොප ගැන දනිමි. ඒ හීලෑ නැති කුලෑටි නොහික්මුණු අශ්වයන් වැඩට යොද ගත හැකි ලෙස හික්මවීම ගැන තොප ප්‍රසිද්ධ බැවිනි. ඒ කාර්යය කරන ආකාරය ගැන දන ගැනීමට මම කැමැත්තෙමි" යි බුදුරජාණන් වහන්සේ පැවසූහ.

එවිට කේසි, "ස්වාමීනි, මම තුන් ආකාරයකින් අශ්වයන් දමනය කරමි. පළමුව අසුන්ට සුදුසු පරිදි හොඳින් ආහාර පාන දෙමි. මෘදු මොළොක් වචනයෙන් කථා කොට හික්මවමි. එසේ නොහැකි වුණොත් සමහර අසුන්ගේ පාද හා මුව බැඳ කෙවිටෙන් තලා සැර පරුෂ වචනයෙන් කථා කොට හික්මවමි. සමහර අසුන් මෘදු මොළොක් වචනයෙන් හා සැර පරුෂ වචනයෙන්ද යන ක්‍රම දෙකින් මත් කථා කොට හික්මවමි" යි කීය.

"හොඳයි කේසිය ඔය කියූ කිසිම ක්‍රමයකින් වත් හික්මවන්නට නොහැකි අශ්වයන් සිටින්නට පිළිවනි. එසේනම් ඔවුන්ට කරන්නේ කුමක්දැයි" යි බුදු හිමියෝ ඇසූහ.

"ස්වාමීනි, එබඳු අසීකරු අසුන් ආචාර්ය පරම්පරාවට අයකීර්තියක් හෝ නින්දවක් හෝ නොවීම පිණිස මරා දමමි" යි කීය.

ස්වාමීනි, ඔබවහන්සේ නොදමුණු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රේෂ්ඨතම ආචාර්යවරයායි. එසේ නම් ඒ උතුම් කාර්යය කරනා අයුරු දන ගන්නට මම කැමැත්තෙමි." යි කේසි විළඹට පවසා සිටියේය.

"කේසිය, මම දමනය කළ යුතු පුරුෂයන් අතුරෙන් සමහරුන් මෘදු මොළොක් වචනයෙන් කථාකොට හික්මවමි. ඒ මේ ආකාරයෙනුයි."

"කාය සුචරිතය මේ ආකාරය, කාය සුචරිතයාගේ විපාක මෙබඳු වෙයි. වාග් සුචරිතය මේ ආකාරය. වාග් සුචරිතයාගේ විපාක මෙබඳු වෙයි. මනෝ සුචරිතය මේ ආකාරය, මනෝ සුචරිතයාගේ විපාක මෙබඳු වෙයි. දෙවියෝ නම් මේ ත්‍රිවිධ සුචරිත ගුණ පිරූ ඇත්තෝය. මනුෂ්‍යයෝ නම් මේ ත්‍රිවිධ සුචරිත ගුණ සපුරා ගත යුතු ඇත්තෝය. යනුවෙන් මෘදු මොළොක් වචනයෙන් ත්‍රිවිධ සුචරිත සංඛ්‍යාත පින් කිරීම පිළිබඳ කරුණු පෙන්වා දෙමින් හික්මී."

"එපමණක් නොවෙයි කේසිය මම දමනය කළ යුතු පුරුෂයින් අතුරෙන් ඇතැමුන් සැර පරුෂ වචනයෙන්ද හික්මවමි. ඒ මේ ආකාරයටයි."

කාය දුශ්චරිතය මේ ආකාරය. කාය දුශ්චරිතයාගේ විපාක මෙසේය. වාග් දුශ්චරිතය මේ ආකාරය, වාග් දුශ්චරිතයා කළ අය අපායේ, තිරිසන් යෝනියේ, හෝ ප්‍රේත විෂයෙහි ඉපිද සිය ජනක සැර පරුෂ කටුක දුක් විඳින්නේ මෙසේය. මනෝ දුශ්චරිතය මේ ආකාරය. මනෝ දුශ්චරිතයාගේ විපාක මෙසේය. ඒ ත්‍රිවිධ දුශ්චරිත මෙසේය. යනුවෙන් පරිකර්ම ඇති සැර පරුෂ වචනයෙන් හික්මවමි."

"නවද කේසිය මම දමනය කළ යුතු පුරුෂයන් අතුරෙන් සමහරු මෘදු මොළොක් වචන සඞ්ඛ්‍යාත පින් කිරීම පිළිබඳ වචනයකම පෙන්වා දෙමින් ද පව් කිරීමෙහි සැර පරුෂ විපාක සහ අනර්ථකාරී බව පෙන්නවාදීම වශයෙන් සැර පරුෂ වචනයෙන්ද යන දෙආකාරයෙන්මත් හික්මවමියි" වදළහ.

අනතුරුව කේසි "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඒ දක්වා වදළ ආකාර තුනෙන් ඔත් හික්මවන්නට බැරි පුරුෂයන් වෙතොත් ඔවුන් හික්මවන්නේ කෙසේදැයි" විමසීය.

කේසිය ඇසූ මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට භාග්‍යවතුන් වහන්සේ උපයෝගී කැර ගත්තේ ඔහු අවසාන වශයෙට දුන් පිළිතුරමය.

"කේසිය මම ඒ තුන් ආකාරයෙන්ම හික්මවීමට බැරි අය වෙතොත් ඔවුන් මරා දමමි" යි වදළහ.

බුදු රදුන්ගේ එම ප්‍රකාශයෙන් විමතියට පත් කේසි විළඹ ප්‍රශ්නය නැගුයේ සිතේ මෝදුවන කුතුහලය පෙරදැරි කැරගෙනය.

"මහා කාරුණිකයාණන් වහන්ස, එය බුදු කෙනෙකුට කැපදැයි මට සිතාගත නොහැකියි."

"කේසිය ඒ කථාව සත්‍යයකි. තථාගතයන්ට පර පණ නැසුම සුදුසු නොවේ."

"ආර්ය විනය අනුව මෙහි නැසීම යනුවෙන් සැලකෙන්නේ දිවි තොර කිරීමක් හෝ පරපණ නැසීමක් හෝ නොව මා විසින් දෙන අවවාද නොපිළිපදින අය අවවාද අනු ශාසනා කිරීමෙන් බැහැර කිරීමයි. එසේත් නැත්නම් අතහැර දමීමයි. එවිට නුවණැති බ්‍රහ්මචාරීහුද ඔවුනට අවවාද අනුශාසනා කිරීමෙන් වළකිත්. සමඟමේ පැවැත්වීමෙන් වළකිත්. ආර්යවිනය අනුව කරන නාසනය හෙවත් නැසීම නම් මෙයයි."


එසඳ කේසි ඉමහත් සොම්නසට පත්ව එය අනුමත කරමින් දෙනෙත් හඟා තථාගතයන් වහන්සේට නමස්කාර දක්වා මෙසේ කීය.

"ස්වාමීන්, භාග්‍යවතුන් වහන්ස, ඉතා මැනවි, ඉතා මැනවි මෙවක් පටන් මා දිවිහිමියෙන් බුදුන් සරණ ගිය උපාසකයකු කොට සලකන සේක්වායි ඉල්ලා" සිටියේය.

**ලේඛන කලාකීර්ති, චිත්‍ර කලා ගුරු**
**ගොංගිතොට ප්‍රේමරත්න**

# සදහම් ප්‍රහේලිකා අංක - 73

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773




### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 72, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, ශ්‍රීමත් එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු තැපැල් පත් එවිය යුතු අවසන් දිනය පෙබරවාරි මස 2 වෙනිදය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ඔබේ ඉල්ලීම පරිදි නිවැරදි පිළිතුරු මෙවර කලාපයේ සිට පළවේ.

### ▶ හරහට

1. මෙම තෙරණියගේ ජීවිත කතාව පාදක කොට නිර්මාණය කළ බෞද්ධ චිත්‍රපටයකි.
3. විපාක දෙන සිව් ආකාර කර්මවලින් එකකි.
6. දුක්, සසර මෙවැන්නකටද උපමා කෙරේ.
8. මෙහි ඇලී ගැලීමෙන් සසර ගමන දික්වේ.
9. බෞද්ධ සාහිත්‍යයේ එන ප්‍රබල චරිතයකි.
11. එක් වූ සිරුරක් ඇත්නාට මේ නමින්ද හැඳින්වේ.
12. මෙවා ගැනීමෙන් හා දීමෙන් වැළකීම යහපත්ය.
13. සිදුහත් කුමරු උපන්නේ මෙබඳු ගසක් යටය.
14. එක්තරා කුල ගෝත්‍රයකි.
15. රාශි දොළසින් එකකි.
17. මෙවා කීමෙන්ද වැළකීම බෞද්ධයා සතුය.

### ▼ පහළට

2. දෙවියන්ට පවන් සලන්නට මෙවා යොදාගනී.
4. මෙය නමා පසුපස ලුහුබැඳ එන බවට විශ්වාසයක් බෞද්ධයින් තුළ ඇත.
5. සුගතියෙහි හෝ දුගතියෙහි උපත ලබන්නට හේතුවන කර්මය මේ නමින් හැඳින්වේ.
7. නිවන් මග සාක්ෂාත් කරගන්නට නම් මෙය පුහුණු කරගත යුතුය.
8. ඉන්දියාවේ සිටි ප්‍රකට කවියෙකි.
10. ජී. බී. සේනානායක ලියූ ජනප්‍රිය නවකතාවකි.
15. ගිහි සුව හතරින් එකකි.

## ඔබත් දළදා වරුණට ලියන්න

දළදා වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන ප්‍රවෘත්ති සඟරාවකි. එසේ අවසාන ආසන්න කාලයක්තිස්සේ "දළදා වරුණ" සඟරාවට ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන කරුණු සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ ප්‍රවෘත්ති පළවන සියලුම ලිපි, රචනා ඊ.ජී. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තව පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

● අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

## ප්‍රහේලිකා අංක 70 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ

- කෞෂිකා ද සිල්වා, 460, මාතලේ පාර, අලවතුගොඩ.
- ආර්. එම්. බී. සෙනෙවිරත්න, 50/21, අරුප්පොල පාර, මහනුවර.
- එස්. එස්. ජේ. කුමාර, 56/6, සිරිසඳ, ගොඩියාදෙනිය.

## දළදා මාලිගයෙන් පණිවුඩයක්

● මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සැරසී ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සැරසී ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සැරසීල්ලී භාවය මේ පින්බිමට සෝභාවකි, එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැණු දෙපිරිසම) පළඳනු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් ආදියෙන් සැරසී එමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට වාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොගැළපෙන බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටින ඔබ පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට ඔබත් සිහිකරනු කැමැත්තෙමු.

# ජය ශ්‍රී මහ බෝ වන්දනාව සහ මහ බෝ පෙරහර ජනවාරි 25 අනුරාධපුරයේදී



**අනුරාධපුර** ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ සිරිලකට වැඩමවා වසර 2321ක් පිරීම, යටිරාවත නාරද ප්‍රධාන සංඝනායක හිමි සිරිමා බෝ සමිඳුන් විවා පළමු රන් වැට ඉදිකොට වසර 44ක් සපිරීම සහ රටවැසි ජනතාවට සෞභාග්‍යය ප්‍රාර්ථනා කරමින් 2014 වසරට සෙත් පැතීම මුල්කරගෙන සිරි සිදුහත් භික්ෂු පදනම සහ සිරිමහ බෝ පදනම මගින් නවවැනි වතාවටත් අසිරිමත් මහ බෝ වන්දනාව සහ මහ බෝ පෙරහර ජනවාරි 25 වෙනි දින අනුරාධපුර ජයසිරි මහ බෝ සමිඳුන් අභියසදී පැවැත්වේ.

මහනුවර ප්‍රධාන දිවයිනේ පළාත්වලට බැතිමතුන් ඒ ඒ ප්‍රදේශවල වගා වන බෝග, අස්වැන්න, බෙහෙත් වර්ග රැගෙන අනුරාධපුර ථූපාරාම චෛත්‍යය මළුවට මෙදින දවල් එකට රැස්වී එතැන් සිට බෝ සමිඳුන් උදෙසා පූජා කිරීම සඳහා මල් පහන් සහ බෝග සමඟත්, මාකට වර්ග මහා පතුයට තැන්පත්කර මහ පෙරහරකින් රුවන්වැලි සෑ සමිඳුන් ඉදිරිපිටින් ජයසිරි මහ බෝ සමිඳුන් වෙත ගමන් කරති. පූජාවන් පැවැත්වීමෙන් අනතුරුව මහ බෝධි පූජාවකින් වන්දනාව සවස හයට නිම කෙරේ. පූජාවට වැඩම කරන මහා සංඝරත්නය වෙනුවෙන් මෙදින චතුමධුර ගිලන්පස ලුණුගම්වෙහෙර බෙහෙරමැන්දනලිය රජමහ විහාරාධිපති නාහිමිවරු ශාසන ආරක්ෂක බල මණ්ඩලයේ සභාපති, වැලිසර ඒනවංශ නාහිමි විසින් පිළිගැන්වූ ඇත.

# බෝධි පුවත්

## මල්වතු මහාවිහාර පාර්ශවයේ කාරක සංඝසභික පදවියෙන් පිදුම් ලබති

**මල්වතු** මහාවිහාර පාර්ශවයේ අතිගෞරවාර්හ ශ්‍රීමත් තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ කාරක මහා සංඝ සභා සම්මතයෙන්, ගොකරැල්ල රම්මණ්ඩා පොකුණ විහාරාධිපති පූජ්‍ය මීණිගමුවේ රතනපාල හිමියන් කාරක සංඝ සභික ධුරයකට පත්කරනු ලැබ ඇත.

පූජ්‍ය මීණිගමුවේ රතනපාල හිමියන් ඓතිහාසික කන්ද උඩරට මීණිගමුව නම් ග්‍රාමයේ දී වර්ෂ 1963 දී ජන්ම ලාභය ලැබ, රාජ්‍ය වර්ෂ 1979 දී පැවිදි බිමට පත්විය. ඒ අතරින් වී වදාළ මල්වතු මහාවිහාරීය කාරක සංඝ සභික ගොකරැල්ල රම්මණ්ඩා පොකුණ විහාරාධිපති හිරියාල හත්පත්තුවේ සංඝනායක කුරගම්මන ශ්‍රී සිද්ධාර්ථ සීලරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් ලෙසය. ගොකරැල්ල පොල්ගොල්ල ශාස්ත්‍රාභිවෘද්ධි පිරිවෙන් විද්‍යායතනයෙන් මූලික අධ්‍යාපනය ලබන අතරවාරයේ වර්ෂ 1984 දී මල්වතු මහාවිහාර උපෝසථාගාරයේ දී පැවිදි උපසම්පදාව ලබා, වර්ෂ 1990 දී කර්මාචාර්ය පදවියකින්ද පිදුම් ලැබූහ.

රාජ්‍ය වර්ෂ 1986 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළු වී 1992 දී සිංහල විශේෂවේදී උපාධිය පළමු සම්මානයක් සහිතව ලබා ගත් අතර, 2001 වර්ෂයේ දී දර්ශනපති උපාධියද , 2006 වර්ෂයේ දී අධ්‍යාපන ඩිප්ලෝමාවද ලබාගත් උන් වහන්සේ දනට කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල විෂය පිළිබඳ දර්ශනශූරී උපාධියට පෙනී සිටීම සඳහා අධ්‍යයනයෙහි යෙදී සිටින්නාහ.

අතිපූජනීය ශ්‍රී දළදා තේවා පූජා සත්කාරයන්හි නියුක්ත වෙමින් පුවත්පත් සඟරා ආදියට ශාස්ත්‍රීය ලිපි සපයන රතනපාල හිමියෝ 'සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථයන්හි නිරූපිත බුද්ධ සංකල්පය' කෘතියේ කතුවරයා ද වෙති. ඉඹිබාගමුව ශාසනාරක්ෂක බල මණ්ඩලයේ අංක 02 කලාපයේ ලේඛකාධිකාරී වශයෙන් කටයුතු කරන අතරම මහනුවර ශ්‍රී සංඝරාජ මහ පිරිවෙනේ ආචාර්යවරයන් වහන්සේ නමක් වශයෙන් ධර්ම ශාස්ත්‍රීය සේවයෙහි නියුක්තව වැඩවාසය කරති.

කේ. බණ්ඩාරනායක

# බුදුරජාණන් වහන්සේ ගැන ලෝක බුද්ධිමතුන් දක්වූ අදහස්



● **බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය**

ඉතිහාසය පුරා ප්‍රචලිත වූ පුද්ගලයින් අතුරින්, ගුණ මහිමයෙන් හෝ ප්‍රඥාවෙන්, ක්‍රිස්තුස් වහන්සේ ඉහළ මට්ටමක සිටින බවක් මට නම් නොහැඟේ. බුදුරජාණන් වහන්සේ එතුමන්ට වඩා ඉහළින් පිළිගත යුතු යැයි මම අදහස් කරමි.

මහා දාර්ශනික බර්ට්‍රන්ඩ් රසල්
(මා කිතුනුවකු නොවන්නේ ඇයි?)

● **බුදුරදුන්ගේ පණිවුඩය**

සියලුම ආගමික ඉගැන්වීම් හා මතවාදයන්ට වඩා බුදුරජාණන් වහන්සේගේ දහම ඉහළ මට්ටමක පවතියි.

උන්වහන්සේගේ සනාතන දහම් පණිවුඩය, යුග ගණනාවක් තිස්සේ මුළු මිනිස් සංහතියම විස්මයට පත්කර ඇත. මෙම සාම පණිවුඩය තිර වශයෙන්ම ගෙවුණු ඉතිහාසයේ වෙනත් කිසිදු යුගයකට වඩා අත්‍යාවශ්‍යකර වූද, විස්මිත වූද අද මිනිස් සමාජයට බෙහෙවින්ම අවශ්‍ය ඇත.

පණ්ඩිත් ජවහර්ලාල් නේරු

● **මිනිස් රුකෙහි පුපිපි සුවඳ පුෂ්පය**

අනන්ත, අපමණ වසර ගණනාවකට පසු අප මිනිස් රුකෙහි පුපිපි මෙම පුෂ්පය ප්‍රඥාවේ සුගන්ධයෙන්ද, මෛත්‍රියේ අමා පැණියෙන්ද ලෝකයම පුරවාලයි.

ශ්‍රීමත් එඩ්වින් ආනල්ඩ් (ආසියාවේ ආලෝකය)

● **මිනිස් වර්ගයා අතර ශ්‍රේෂ්ඨතම පුරුෂයාණෝ**

මිනිස් වර්ගයා අතර පහළ වූ අති ශ්‍රේෂ්ඨ පුරුෂෝත්තමයාණන් කවුරුන්දැයි අවබෝධ කරගැනීමට කැමැත්තේද? යාචක විලාසයෙන් සැරිසැරීමෙහි පිළිපන් රාජෝත්තමයාණන් කවුරුන්දැයි මෙනෙහි කරන්න. මුළු හදින්ම පිළිපැදිය යුතු, ඒ ශ්‍රේෂ්ඨතම පුරුෂෝත්තමයාණෝ බුදුරජාණන් වහන්සේය.

අබ්දුල් අනාහියා (මුස්ලිම් ජාතික කවියෙකි)

● **බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා**

මිනිස් වර්ගයා අතුරින් උපරිම සම්භාවනාවෙන් පූජෝපහාර ලද එකම පුරුෂෝත්තමයා, බුදුරජාණන් වහන්සේම බැව් වෙන් කොට සඳහන් කළ හැකිය.


මහාචාර්ය සෝන්ඩර්ස් (සාහිත්‍ය ලේකම්, වයි.එම්.සී.ඒ.) (ඉන්දියාව, බුරුමය, ශ්‍රී ලංකාව)

● **ගුණ මූර්තියක්**

බුදුරජාණන් වහන්සේ දෙසා වදළ සදහම් ගුණ සමුදයෙහි ගුණ මූර්තිය උන්වහන්සේමය. උත්තරීතර මහඟු සිල්වත්කමින් පරිපූර්ණ 45 වසරක වළදයි ලෝවැඩ සේවා කාලය තුළ දේශිත දහමට අනුවම පිළිවෙත් පිරූ උන්වහන්සේ රාගාදී කෙලෙස් ඇතුළු අනන්ත, අපමණ මිනිස් දුර්ගුණවලින් මිදුණු සේක. ලෝකයේ මෙතෙක් දන ගැනීමට ලැබුණු පරිපූර්ණ සාරධර්ම පද්ධතිය බුදුරජාණන් වහන්සේගේය.

ජර්මන් ජාතික මහාචාර්ය ( මැක්ස් මුලර් )

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැසීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# දළද ඉතිහාසයෙන් බිඳක්

කෝට්ටේ රජ කළ ධර්මපාල රජු (1551-1597) රෝමානු කතෝලික ධර්මය වැළඳ ගත්තේ 1557 දිය. ඒ වන විට කෝට්ටේ දළද මැළුරේ දියවඩන නිලමේ පදවිය දැරුවේ හේමමාලා දන්ත කුමරු පරපුරෙන් පැවත ආ හිරිපිටියේ ඒකනායක දියවඩන නිලමේය. ලංකාවේ ශාසන ඉතිහාසයේ දියවඩන නිලමේවරයෙකුගේ නම පළමුවරට සඳහන් වන්නේ මෙහිදිය. දළද හිමිට අනතුරක් වන බව තමා දුටු සිහිනයකින් දැනගත් ඒකනායක රාළ වෙස් වළාගෙන දළදා හිමි සඟවාගෙන දියවන්නා ඔය පීනා සීතාවක මායාදුන්නේ රජු (1521-1581) වෙත ගොස් දළද හිමි භාර දුන්නේය. මායාදුන්නේ රජු ඉමහත් ගෞරවයෙන් දළද හිමි පිළිගෙන දෙල්ගමුවේ දෙමහල් විහාරයේ ඒ තැන්පත් කළේය. අලගිය වන්න ලිවූ සැවුල් සංදේශයේ දෙල්ගමුවේ දළද හිමි වර්ණනා වෙයි. පසුකල ආරක්ෂාව පිණිස දෙල්ගමු විහාරයේ වැඩසිටි දළද හිමි යෝධ කුරහන් ගලක යටි පතුලේ සිදුරක සඟවා ගෙන තබා ඇත. මෙකල දෙල්ගමු විහාරයේ සිට වාර්ෂික ඇසළ පෙරහර රත්නපුර සමන් දේවාලය වෙත ගොස් ඇත.

සීතාවක මායාදුන්නේ රජුට පසු සීතාවක රාජසිංහ රජු (1578-1592) රජ විය. ඔහු උඩරට යටත් කොට ඔහු වෙනුවෙන් උඩරට පාලනය ගෙන ගිය වීරසුන්දර බණ්ඩාර බොරුවළක ලා මැරවූ බව "අලකේශ්වර යුද්ධය" හා රාජාවලිය යන වංශ කතාවල කියවෙයි. වීරසුන්දර බණ්ඩාර මැරවූ පසු ඔහුගේ පුතා වූ කොණප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත එකතු වී කොළඹ හා ගෝවට ගොස් වැඩිදුර යුද්ධ ශිල්ප හදාරා ඇත. පසුව උඩරට අල්ලා ගැනීමට පැමිණි පෘතුගීසි හමුදවක් සමඟ කොණප්පු බණ්ඩාර උඩරටට පැමිණ පසුව පෘතුගීසීන්ට විරුද්ධව නැගී සිට බුදු දහම වැළඳගෙන පළමු විමලධර්මසූරිය යන නමින් 1592 උඩරට බලයට පත්විය. ඒ බව දැනගත් සීතාවක රාජසිංහ රජු ඔහු සමඟ සටනට අවුත් 1592 බලන සටනින් පරාජය වී සිත් තැවුලෙන් ආපසු පැදී පෙතංගොඩ උයනේදී උණ කටුවක් ඇනී විස වී මළේය.

උඩරට බලයට පත් පළමු විමලධර්මසූරිය රජුට රාජ්‍ය අයිතිය තහවුරු කරගැනීමට දළද හිමි ලබා ගැනීමට ප්‍රධාන කරුණක් විය. එනිසා පළමු විමලධර්ම රජු සීතාවක දෙල්ගමු විහාරයේ වැඩ සිටි දළදා කරඬුවේ භාරකරු වූ හිරිපිටියේ ඒකනායක දියවඩන නිලමේ සමඟ රහසේ සාකච්ඡාවට ඇල්ලේපොළ මංගල හිමි ප්‍රධාන පස් නමක් දෙල්ගමු විහාරයට යැවූ බව "අස්ගිරි උපත" පුස්කොළ ග්‍රන්ථය කියයි.

ඇල්ලේපොල මංගල හිමි හිරිපිටිය රාළගේ සිත දිනා ගනිමින් දෙල්ගමුවේ වැඩ විසූ දළද හිමි දෙල්ගමුවේ සිට ඉදල්ගස්හින්න හරහා ලාව පාරෙන් සෙංකඩගලට වැඩමවීමට සැලසුම් සකස් කළේය. දළද හිමි සෙංකඩගලට වැඩමවීමට පෙර ඒ සෙංකඩගලට වැඩම වීමට ඉඩ ඇති ගමන් මාර්ග ගැන ගලැඩහිමි සමඟ සාකච්ඡා කළ බව "දළද පුවත" කාව්‍ය ග්‍රන්ථය කියයි. රජු බලාපොරොත්තු නොවූ මොහොතක කෙටි කලකින් ලාව පාරෙන් අම්පිටිය හරහා දළද හිමි සෙංකඩගලට වැඩම්වා ඇත. එහිදී පළමු විමලධර්ම රජු සෙංකඩගල නගරය සරසා අම්පිටියට පෙර මඟ ගොස් දළද හිමි මහත් ගෞරවයෙන් බාර ගත් බව "දළද පුවත" කාව්‍ය ග්‍රන්ථය කියයි. දළද හිමි සීතාවක සිට සෙංකඩගලට වැඩමවීමට මූලිකව කටයුතු කළ තිපදෙනෙකු ඇත.

1. කෝට්ටේ අග කාලයේ - අවුරුදු 35 ක් පමණ සීතාවක දියවඩන නිලමේ පදවිය දැරූ හා (නැවත සෙංකඩගල මුල්ම දියවඩන නිලමේ පදවිය පත්වූ) හේමමාලා දන්ත කුමරු පරපුරට අයත් හිරිපිටියේ ඒකනායක දියවඩන නිලමේ.
2. සීතාවක රාජසිංහ රජුට විරුද්ධව පළමු විමලධර්මසූරිය රජු උඩරට බලයට පත්කිරීමට පෙනෙවීන් මූලිකව කටයුතු කළ දෙවනගල රත්නාලංකාර හිමි
3. කිරිඇල්ලේ ඥානවිමල හිමි "සබරගමුවේ පැරණි ලියවිලි" හා "සබරගමු දර්ශන" යන ග්‍රන්ථවල සඳහන් කරන ගලැඩ හිමි. (ගලැඩ හිමි යනු කඳු ගැටයක් වූ දෙවනගල කඳු මුදුනේ වැඩ සිටි දෙවනගල රත්නාලංකාර හිමිම විය හැක.)
4. "අස්ගිරි උපත" සඳහන් කරන ඇල්ලේපොල මංගල හිමි



සෙංකඩගලට වැඩමවූ දළදා වහන්සේ මහනුවර මුලින් වැඩ සිටි ස්ථාන පහත දැක්වෙයි.


1. එක් රැයක් - දින කීපයක් හෝ කෙටිකලක් මහනුවර ආදාහන මළුව විහාරය. මේ සිහිකිරීමට අදත් දිය කපනද රාත්‍රී පෙරහර කරඬුව අස්ගිරිය ගෙඩිගේ විහාරයට වැඩමවෙයි.
2. ඉන් පසු පළමු විමලධර්මසූරිය රජුගේ රජ මාළිගාවේ කොටසක් වූ "සඳ දකිනා ගෙයි" දළදා හිමි වැඩසිටි බව දළද පුවත කාව්‍ය ග්‍රන්ථය කියයි.
3. සිංහල දළද වංශය - චූලවංශය - අස්ගිරි තල්පත - පුස් රාජාවලිය - දළද පුවත - අස්ගිරි උපත - නරේන්ද්‍ර චරිතාව ලෝකන ප්‍රදීපිකාව යන වංශ කතා අනුව පළමු විමලධර්ම රජු කරවූ දෙමහල් දළද මැදුර.
4. පසු කල මේ දෙමහල් දළද මැදුර අසලම විමලධර්ම රජු වෙනම තුන්මහල් මාලිගාවක් කල බව සිංහල දළද වංශය දළද පුවත - දෙවන දළද පූජාවලි - ශාසනෝ සම්පදවත යන ග්‍රන්ථ වල කියවෙයි.

එස්.කේ. ජයවර්ධන



කෝපයෙන් මත් වූ පැහැදන්නා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය

බෝසත් බණ කතා



# රජ කුමරාට හමුවූ සඳ කිඳුරිය

මෙලොව ජීවත් වන අන් කවර හෝ පුද්ගලයකුට නැති සතුටක්ලද දෙයින් සතුටු වන පුද්ගලයාට ඇතැයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. මහා ධන සම්පත් ඇති සිටු කුමරකුටත් වඩා ගෙනෙම තම ජීවිතය තුළින් අසීමිත සතුටක් ලබයි. මෙලොව පරලොව දියුණුවට හේතු වන ලද පමණින් පිහිටිය සතුටුවීම කෙනෙකු තුළ පිහිටිය යුතු උතුම් ගුණාංගයක් බව පවසන බුදුරජාණන් වහන්සේ එයම මංගල කාරණයක් බවට පෙන්වා දී තිබේ.

තෘෂ්ණාවෙන් තොරව ධාර්මිකව හරි හම්බ කර ගනිමින් අනායන්ගේ හිත සුව පිණිස කටයුතු කරන නැණැත්තාට ඇත්තේ උපේක්ෂා සහගත සිතකි. ගෙනෙම අනායන්ගේ දියුණුව දැක සතුටු වෙයි. ඊර්ෂ්‍යා ක්‍රෝධ මද මාන්න දී දුර්ගුණයන්ගෙන් තොර ඔහු නිරන්තරයෙන්ම කුසල් සිත් පහළ කර ගනී. එනිසා කෙනෙකු තුළ පවතින සැබෑ සතුට උතුම් වූ ධනයක් සේ අගනේය. "සන්තුට්ඨී පරමං ධනං" ලෙසුවෙන් බුදු පියාණන් වහන්සේ වදළේ ඒ නිසාය.

නමුත් එසේ වුවද බොහෝදෙනා තුළ නැත්තේද මෙකී සතුටය. කොතෙක් මිල මුදල් තිබුණත්, ගෙවල් දොරවල් යාන වාහන ඇතත්, දසි දස්සන් සිටියත් කෙළවරක් නැති වස්තු කාමයෙන් සැප සොයා යන්නාට කොයිම මොහොතකවත් සිතේ සතුටක් නැත. අසීමිත තෘෂ්ණාව නිසා ඔහු සිතින් දිළින්දෙකි. මානසික රෝගියෙකි. ඔහු දිවා රාත්‍රී විඳින දුක් ගැහැට නොනෙයාකුට දරිය නොහැකිය. එය එතරම්ම වේදනා සහගතය.

ලද දෙයින් සතුටු විය නොහැකි පුද්ගලයාට තමා සන්තක දෙය ඉතා සුළුය. ඔහු අනුන් සතු දෙයක් වුවද ලබා ගැනීමට දක්වන්නේ දැඩි කැදර බවකි. මේ නිසා බොහෝ විට සිදුවන්නේ තමා සන්තක දෙයද අහිමිව විනාශයට පත්වීමය. පමණට වඩා ගමන් ගැන ඇලීමෙන්, බැඳීමෙන්, මිනිසා පිරිහීමට යන මංපෙත්ය. ඒ බව මතු සඳහන් අතීත කතාවෙන් මනාව පැහැදිලි වේ.

යටගිය දවස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍යය කළේය. මෙම රජතුමාට පුතණු කෙනෙක් විය. මේ පුත් කුමරුවා කුඩා කාලයේ පටන්ම පිය මහ රජතුමාට කීකරු තමන් නොදන්නවූ, දරුණු අදහස් ඇති තිතුවක්කාර පුද්ගලයකු විය. සිය පියාණන්ගේ රාජ්‍ය මිලය පියාට නොව අපූරු අසාධාරණ ලෙස රට පෙළීමේ කටයුතුවල නිරත වන්නට විය. බොහෝ සේ වැරදි කළ හෙයින් ඔහු කෙරෙහි වෛරීසියා කලකිරීමට පත්විය.

තරුණ පුත් කුමරුගේ නරක ක්‍රියාකාරකම් වලට නැති සිරිතට නොහැකි වූ පිය මහ රජු පුත් කුමරුට දඬුවම් පමුණුවන ලදද සිටිද පුත් කුමරුට දඬුවම් ... වූ රාජ කුමාරිකාවද සමඟ රාජ කුමාරයා එම රාජ්‍යයෙන් පිටුවහල් කිරීමය. මෙසේ එම රාජ්‍යයෙන් පිටුවහල් වූ රාජ කුමාරයා සහ එම කුමරිය බොහෝ දුර කතර ගෙවා ගොස් වනගත වූහ. මෙසේ වනගත වී වනයේ විශාල වෘක්ෂයක් පාමුල කුඩා පැල්පතක් ඉදිකර ගනිමින් වාසය කළ ඔවුන්ගේ ආහාරය වූයේ වනාන්තරයෙන් ලබාගන්නා ලද පලතුරු හා සතුන්ගේ දඩ මස්ය. රාජ කුමරිය පැල්පතේ තනිවම සිටියදී දිවා රාජ කුමරු ආහාරය පිණිස කිසියම් කාලයේ රාජ කුමරු ආහාරය පිණිස සොයා ගියේය.

මෙලෙස දින කීපයක් ආහාර සොයමින් වනයේ ඇතුළට ඇවිද ගිය කුමරුට දිනක් සඳ කිඳුරියක් මුණ ගැසුණි. දින දෙක තුනක් සඳ කිඳුරිය මුණ ගැසීමෙන් අනතුරුව ඇගේ රූප ශෝභාව ගැන කුමරුට හද ආශාවක් ඇති විය. සිය රාජ කුමරිය අමතක කළ රාජ කුමාරයා කිඳුරිය ලබාගෙන ඇය සමඟ විසීමෙ සේ නම් සුව විඳින්නෙමැයි සිතක් ඇතිකර ගත්තේ ඇය සමඟ වනාන්තරයේම ජීවත් වීමට අධිෂ්ඨාන කළේය.

කිඳුරිය පිළිබඳව දැඩි ඇල්මකින් පසුවූ කුමාරයා ඇයව ලුහුබඳිමින් වනයේ බොහෝ ඇතුළට ගමන් කළේය. මෙසේ යන අතර මග සඳ කිඳුරිය අතුරුදන් වූවාය. මාස කීපයක් කිඳුරිය සොයමින් වනය පුරා සැරි සැරූ ගෙනෙම තම බිරිඳ රාජ කුමාරිකාව වෙත නොගියේය. පසු කිඳුරියව සොයා යෑම් රාජ කුමාරයා පරාජිත වූ බව දැන රාජ කුමාරිය විසූ පැල්පත සොයා ගියේ එහි අවසානයේය.

රාජ කුමාරයා පුදුමයට පත්විය. පැල්පත මනාව පිළියෙළ කුරු වළලෙන් අලංකාර වූ තාපසාරාමයකි. පිටියෙන් හා පැකිළෙයන් ආරාමයට එබී බැලූ ඔහුට දක ගන්නට ලැබුණේ ධ්‍යානයට සමවැදී සිටි තාපසිකාවකි. ඇය නම් රාජ කුමරියම බව දැන හැඳින ගැනීමට කුමරුට වැඩි කාලයක් ගත නොවීය.

මේ වනවිට මාස ගණනකින් ආපසු නොපැමිණි රාජ කුමාරයා ගැන කුමරිය තුළ කලකිරීමක් ඇති විය. ඇය ජීවත් වූ මහ වනාන්තරයේම එක් ප්‍රසන්න විසූ ධ්‍යානලාභී තවුසාණන් කෙනෙකු වෙතින් භාවනා පුහුණුව හා ධ්‍යානය උපදවා සෑදීමට ලබා සිටියාය. රාජ කුමාරයා තමාගෙන් සිදුවූ වරද ගැන අනුතාපිකා කරන ලෙස ඇයගෙන් සමාව ඉල්ලා සිටියද ඔහුට තරුණු පහද දුන් තාපසිකා තොමෝ,

"තමන්ට අයිති නැත් දේ ලබාගැනීමට යාමෙන් විපාක වැඩි ඇති බවත්, ලද දෙයින් සතුටුවීම තරම් සැපතක් වෙනත් නැතැ" යි අවවාද කොට ඔහුගෙන් වෙන්ව වෙනත් ස්ථානයක් බලා අහසින්ම ගියාය.

අන් සතු දේ ගැන අධික තණ්හාවෙන් බලාපොරොත්තු තබා එය පසු පස යාමෙන් එම බලාපොරොත්තු පමණක් නොව තමා සතුව පැවති දෙයද නැතිවී මහත් විනාශයට පත් වන්නේය යනු මෙම සතාන්තරයෙන් උගත හැකි පාඩමය.

සෝමරත්න බත්තගොඩ



# ඓතිහාසික මගුල් මඩුව පිළිබඳ ඔබ නොදන්නා යමක්

සිංහලයේ පුරාණ රජවරු රට පාලනය කළ රාජ සභා මණ්ඩපයන්හි පැහැදිලි නටබුන් මතුවන්නේ පොළොන්නරුව සහ මහනුවර යුගවලදී පමණි. අදටත් පොළොන්නරුව යුගයේ පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ සභා මණ්ඩපය වන රාජ වෛශ්‍ය භුජංග මණ්ඩපයේද, නිශ්ශංකමල්ල රජුගේ රාජසභා මණ්ඩපයේද නටබුන් සුරක්ෂිතව පවතී.

මහනුවර රජ මාළිගයේ මගුල් මඩුව, පොළොන්නරුව මගුල් මඩුවෙන් ආභාසය ලබා දවයෙන් ඉදිකළ විශිෂ්ට නිර්මාණයකි.

ඓතිහාසික මගුල් මඩුව මුලින්ම ඉදිකරනු ලැබුවේ රාජාධිරාජසිංහ රජු 1784දී බව ඉංග්‍රීසි ලේඛක ජේ. සී. ලුවිස් සඳහන් කර ඇති අතර ආනන්ද කුමාරස්වාමි මහතා සඳහන් කරන්නේ මෙය ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ නිර්මාණයක් බවය.


එහෙත් සිංහලයේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු, රජවූයේ 1798දී වන අතර 1798දී රාජාධි රාජසිංහ රජ

> "රාජාධි රාජසිංහ රජු විසින් මගුල් මඩුව නිර්මාණය කිරීම සඳහා දේවේන්ද්‍ර මූලාචාරියාට භාර දෙනු ලැබිණ. මේ සඳහා අවශ්‍ය හල්මිල්ල, නා වැනි දැව රැගෙන එන ලද්දේ නාලන්දා කැලයෙනි. නමුත් රාජාධි රාජසිංහ රජුට එහි වැඩකටයුතු නිමා කිරීමට අවස්ථාව නොලැබිණ."

සමයේ ඉංග්‍රීසින් මහනුවරට ඇතුළු වන විටත් මෙම ගොඩනැගිල්ල අසම්පූර්ණව පැවැති බව ජේ. සී. ලුවිස් සඳහන් කර ඇත. මහාවංශයේ මෙම ගොඩනැගිල්ල පිළිබඳ සඳහන් කර නොමැති අතර එහි ආරම්භය පිළිබඳ වෙනත් සාධකද හමුවී නැත. පුරාණ ප්‍රකට කාව්‍ය විමර්ශනය කිරීමෙන් බොහෝවිට මගුල් මඩුව රාජාධි රාජසිංහ රජු විසින් ආරම්භ කරන්නට ඇති බව සිතිය හැකිය.

රාජාධි රාජසිංහ රජු විසින් මගුල් මඩුව නිර්මාණය කිරීම සඳහා දේවේන්ද්‍ර මූලාචාරියාට භාර දෙනු ලැබිණ. මේ සඳහා අවශ්‍ය හල්මිල්ල, නා වැනි දැව රැගෙන එන ලද්දේ නාලන්දා කැලයෙනි. නමුත් රාජාධි රාජසිංහ රජුට එහි වැඩකටයුතු නිමා කිරීමට අවස්ථාව නොලැබිණ.

ඒ අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජුද එහි වැඩ කරගෙන යන්නට ඇත. එහෙත් 1803දී සිදුවූ ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණයේදී



බොහෝ ගොඩනැගිලි ගිනි තබා විනාශ කළ බව 1803 පෙබරවාරි 24 දින ඉංග්‍රීසින් කොළඹ සිට නිකුත් කළ ගැසට් පත්‍රයේ සඳහන් වේ. එහිදී දව ගොඩනැගිල්ලක් වූ මඟුල් මඩුවටද හානි පැමිණෙන්නට ඇත. මේ නිසා වැඩි අවසන් වීමට පෙරම විනාශයට පත්වූ මෙම ගොඩනැගිල්ල ඉංග්‍රීසින් මහනුවර යටත් කරගත් 1815 වන විටත් මඟුල් මඩුව අසම්පූර්ණ ස්වභාවයකින් පැවතිණ.

ඇසළ උත්සවය හා සම්බන්ධ චාරිත්‍රවලටද මඟුල් මඩුව සම්බන්ධ කරගෙන ඇත. එනම් රන්දෝලි පෙරහර පවත්වන දින පහේදීම පෙරහර අවසන් වූ පසු දේවාල හතරේ කපුරාළවරු මඟුල් මඩුවට පැමිණ මංගල අෂ්ටක ගායනා කරති. දෙවියන්ගේ ගුණ වැයීමෙන් පසුව රජතුමා ආරක්ෂා කර සියලුම යස ඉසුරු ලබා කර දෙන මෙන් දෙවියන්ගෙන් අයදිති. ඉන් අනතුරුව මඟුල් මඩුවෙන් ලබාගත් මල්දම් රැගෙන සිය දේවාලවලට යන ඔවුහු ඒ මල්දම්වලින් දේව රූප සරසති.

උඩරට රජවරුන් සහ ඉංග්‍රීසි ආණ්ඩුව යන දෙපිරිසගේම සංයෝගයෙන් ඉදිවූ එකම ඓතිහාසික ගොඩනැගිල්ල ලෙස මහනුවර මඟුල් මඩුව වැදගත් වේ.

උඩරට නායක්කර් වංශික රජවරු සිය අදිකාරම් සහ අනෙකුත් නිලමේවරු පිරිවරාගෙන රාජ්‍ය පාලන කටයුතු ගෙන ගියේ මෙම ගොඩනැගිල්ලේ සිටය. එලෙසම රජු යුක්තිය පසිඳලමින් අධිකරණ කටයුතු ගෙන ගියේද මෙහි සිට බැවින්, අතීතයේදී ඓතිහාසික මඟුල් මඩුව "මහනඩුව" යන නමින්ද හඳුන්වා ඇත. මහ නඩුව යනු ශ්‍රේෂ්ඨාධිකරණය යන අරුත ඇති හැඳින්වීමකි. රාජ සභාව පවත්වන විට මෙහි දව කුලුණු රතු පැහැති රෙදිවලින් රැළි පාලම් ඇද ඉතා අලංකාර අයුරින් සරසා තිබී ඇත.

එමෙන්ම උඩරට රජවරුන් මෙන්ම ඉංග්‍රීසින්ද මෙය විනිශ්චය ශාලාවක් ලෙස භාවිත කර ඇත.

1815 මාර්තු මස 2දා උඩරට ගිවිසුම අත්සන් කරන ලද්දේද මෙහිදීය. එලෙසම 1818 උඩරට කැරැල්ලේ ප්‍රධාන චූදිතයන් වූ මොණරවිල කැප්පෙටිපොල සහ මඩුගල්ලේ නිලමේ ඇතුළු සිංහල නායකයන්ට මරණ දඬුවම නියම කරන ලද්දේද මඟුල් මඩුවේ සිටය.

ඓතිහාසික වශයෙන් වටිනාකමකින් යුත් මඟුල් මඩුව දළදා මාලිගාවට පැමිණෙන අපට ඉතා පහසුවෙන් නැරඹිය හැකිය. උඩරට ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය හෙළිකරන තවත් වැදගත් සාධකයක් ලෙසද මෙය හැඳින්විය හැකිය. මහනුවර යුගයේ ශිල්පීන් දව භාවිතය සම්බන්ධයෙන් දක්වූ විශේෂ හැකියාව කෙතරම් දැයි ඓතිහාසික මඟුල් මඩුව අදටත් ලොවට විද්‍යාමාන කරයි.

මයුර රොෂාන් කුමාර ජයසිංහ

